ශක්ති ප්‍රබෝධනය පවුලේ සඟරාව

# ශක්ති ප්‍රබෝධනය

සියවසක් ඉක්මවූ නොනවතින යුග මෙහෙවර

2022 පෙබරවාරි | 123 වන කාණ්ඩය - 02 කලාපය | පිටු 32 | QD/NEWS/09/2022




# තිළිණයකි ජීවිතේ

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල සඟරාව

ආරම්භය 1899

# පෙරුම් පුරාගෙන ආ සංසාරේ....

පද රචනය - මහකණුමුල්ලේ වජිර හිමි
තනු නිර්මාණය - සේනානායක වෙරලියද්ද
ගායනය - සේනානායක වෙරලියද්ද



පෙරුම් පුරාගෙන ආ සංසාරේ
පැතුම්ද සුනු විසුනුව වැටුණේ
කාටද රිදුණේ කවුරුද හැඬුවේ
දුම්රිය මොහොතක් නතර වුණේ...

මලක් වගේ රොන් සුවඳ වගේ
ජීවිතයේ සුව අපමණ වේ...//
දොළක් වගේ දිය දෝත වගේ
ජීවිතයේ අම සිසිල දැනේ....

පෙරුම් පුරාගෙන ආ සංසාරේ...

වරක් නෙතග කඳුළැලි පිරුණාදෝ
සිතට දරාගනු බැරි දුක් විදෝ....//
දිවිය මොන තරම් සුන්දරදෝ
දුකම කොයි තරම් සතුටක්දෝ...

පෙරුම් පුරාගෙන ආ සංසාරේ...

මිනිස් ජීවිතය තරම් උතුම් තිළිණයක් මෙලොව තවත් නම් තිබේද? එහෙත් ඒ තිළිණය ලබන්නා විසින්ම එය නිරපරාදේ විනාශ කර ගනී නම්... රිදුම් දුන් පුද්ගලයාව නැවත රිදවන්නට සිතා තම ජීවිතයෙන්ම සමුගන්නේ නම්... එය කොයිතරම් නම් අඥාන ක්‍රියාවක්ද?

එවැනි වූ සත්‍යය සිදුවීමක් පාදක කරගෙන මහකණුමුල්ලේ වජිර හිමියන් විසින් වදන්වැල් ගැලපූ, සේනානායක වෙරලියද්දයන්ගේ ගැඹුරු ස්වරයෙන් හැඩවූ, මේ අපූරු ගීතය, ජීවිතයේ අපමණ අගය සහ සුන්දරත්වය අපට කියා දෙන ගුරුවරයකු වැනිය. සිහින පැතුම් සුනුවිසුනු වුවද, බලාපොරොත්තු අනපේක්ෂිතව බිඳවැටුණද, කළ යුත්තේ ජීවිතයට සමුදීම නොවේ. ඒ වෙනුවට එම ශෝකාකුල අත්දැකීම හරහා කෙනකුට ප්‍රඥාවේ පහන්සිළු දල්වාගත හැකිනම්... වඩා සවිමත්ව ජීවිතයට මුහුණ දීමට අධිෂ්ඨාන කරගත හැකිනම්... දුක වේදනාව තුළම සතුට ප්‍රීතිය රැඳී තිබෙන බව උගත හැකිනම්... පරාජයන් යනු වෙස්වලාගෙන පැමිණෙන ජයග්‍රහණයන්ම බව රචකයා සියුම් ලෙස ඒත්තු ගන්වයි.

වර්තමානයේ උඩුයටිකුරු වන මෙවන් සමාජ, ආර්ථික සහ දේශපාලන වටපිටාවක් තුළ, ජීවිතය වනාහි මලක් සේ සුවඳ විහිදන, දොළක් සේ සිසිල සලසන, උත්තුංග සහ අසමසම තිළිණයක් බව අපට නැවත පසක්කර දුන් මේ සුවිශේෂ ගීතය, ලාංකේය ගීත ඉතිහාසයේ නොමැකෙන සලකුණක් සටහන් කළ බව නම් කිව යුතුමය.

ගරු ශානිල් දිනුක ජයවර්ධන නි. ම. නි. පියතුමා
රෝමයේ සිට

# ශක්ති ප්‍රබෝධනය

2022 පෙබරවාරි


**ප්‍රකාශනය**

නිර්මල මරිය නිකාය

**භාරකරු**

අතිගරු රොෂාන් සිල්වා නි.ම.නි. පියතුමා
නිර්මල මරිය නිකායික ප්‍රාදේශාධිපති
කොළඹ ප්‍රාදේශිකය

**සංස්කාරක**

ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා

**සංස්කරණ සහාය**

රූපස් ප්‍රැන්සිස්
ටී. සුනිල් ප්‍රනාන්දු
ෆිලීෂන් අබයකෝන්

**මුද්‍රණ සැලසුම හා කවර නිර්මාණය**

අචල රූපසිංහ

**මුද්‍රණය**

කතෝලික මුද්‍රණාලය
කොළඹ 08.


## පිටුවෙන් පිටුව..........


2 කවරයේ කථාව

3 හෙළිදරව්ව

5 තිළිණයකි මේ ජීවිතේ
- ගරු විලියම් ඉවාන්ස් පියතුමා

6 ජීවයේ රහස
- ගරු සුමෙත් පෙරේරා ජේ. නි. පියතුමා

8 තහනම් වෘත්තිකයාට....
- වෛද්‍ය සවිත මිලින්ද මෙන්ඩිස්

10 පරිසරය සුරකිමුද....
- කේ. ඒ. රෝලන්ඩ් ලෙස්ලි

11 අමිතගේ හද ගැස්ම - සී. අමිත

12 නිදහස වගකීමකි
- එම්. සී. බෙන්ජමින් පෙරේරා

14 පැතුම් පොදි
- සී. ආර්. ඩික්සන් ඇන්ටනි

16 ක්‍රිස්තුස්වහන්සේ උදෙසා....
- ටී. ක්‍රිශාන් ප්‍රනාන්දු

18 ජීවිතය තිළිණ පුෂ්ප මංජරියකි
- වි. ලෙ. පීරිස්

19 චුට්ටා
- ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ. තු. නි. පියතුමා

20 මතවාද සහ මතභේද - සපුගස්කන්දේ රංජිත්

22 ජීවත් කළ යුතු තිළිණය - බී. කුරුකුලසූරිය

23 ඕං එහෙනං - ජෝසප් ඩයස්

24 පුංචි විකුම් - සූරිය මාමා

25 ප්‍රහේලිකා අංක - 65
- ගරු චාමික සුදර්ශන නි. ම. නි. පියතුමා

26 උතුම් තිළිණයේ.... - බුද්ධික සඳරුවන්

27 වගකීමක් වූ නිදහස - මනුක වීරසේකර

28 කතෝලික ධර්මය අ.පො.ස. (සා./පෙළ) 2022 ආදර්ශ ප්‍රශ්න පත්‍රය - II කොටස
- ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය

30 අ.පො.ස. (උ./පෙළ) ක්‍රිස්තියානි ධර්මය විශ්ව සහා ඉතිහාසය V - එස්. හේමාල් පෙරේරා

31 සන්සුන් කළ සිත
- ගරු එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා

32 මහලු විය - එම්. ඒ. ඩී. රුවිනි කාවින්ද්‍යා

වසර 1899 සිට අඛණ්ඩව එළිදක්වන භක්ති ප්‍රබෝධනය ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල සඟරාවයි. භක්ති ප්‍රබෝධනය නිර්මල මරිය නිකායේ කොළඹ ප්‍රාදේශිකයේ භාරකාරත්වය යටතේ පළවන ප්‍රකාශනයකි. (නි.ම.නි.)

Bhakthi Prabodhanaya, Published continuously since 1899, is the oldest Sinhala magazine in Sri Lanka. Bhakthi Prabodhanaya, is owned and published by the Colombo Province of the Oblates of Mary Immaculate. (O.M.I.)




**කවරයේ කථාව**

මනුෂ්‍ය ජීවිතය විවිධ අවධිවලට බෙදා විග්‍රහ කළ හැකිය. මව් කුසයෙන් බිළිඳෙක් උපදියි. පසුව ළදරු, ළමා, නව යෞවන, තරුණ, මැදිවිය, ජ්‍යෙෂ්ඨ සහ වයෝවෘද්ධ යනුවෙන් ජීවිතයේ පැවැත්ම විවිධ ය. ඒ විවිධත්වය විටක මටසිලිටි ය. විචිත්‍ර ය. වර්ණවත් ය. සුන්දර ය. ප්‍රීතිමත් ය. අමිහිරි, වේදනාත්මක, අඳුරු ආදි කෝණවලින් පවා කෙනකුට එදෙස බැලිය හැකිය. වෙනත් සත්ත්වයන්ගේ ජීවිතවලට සාපේක්ෂව මිනිස් ජීවිතය අසමසමය. ජීවිතයේ හැම අවධියක්ම දෙවියන්වහන්සේ තම දෝතින් මිනිසාට ප්‍රදානය කරන්නේ තිළිණයක් තුළ ඇති ත්‍යාග ගණනාවක් ලෙසය. විවිධ අවධිවල පැවැත්ම කිසියම් ස්ථානයකට සීමාවේ. ඔරලෝසුව මගින් පෙන්නුම් කරන්නේ ජීවිතය කාලයකට නිර්ණය වන බවය. මනුෂ්‍යයන් නොඉල්ලා ලබන මේ අසමසම ජීවිතය දෙවියන්වහන්සේ ප්‍රදානය කරන තිළිණයක් යන්න කවරයේ කථාව මතුකරයි.

ගරු එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා

**භක්ති ප්‍රබෝධනය**

දායකත්වය එක් වසරකට - රු. 550.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)

දායකත්වය සය මසකට - රු. 275.00
(මුද්දර ගාස්තුව ද ඇතුළුව)

සියලුම ලිපි, දායකත්ව මුදල් හා විමසීම් මේ ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක පියතුමා.
"භක්ති ප්‍රබෝධනය"
265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.
දුරකතන : 0112 698 177
විද්‍යුත් තැපැල :
bhakthi.prabodhanaya@gmail.com

**BHAKTHI PRABODHANAYA**

Local Subscription Rate.
Rs. 550.00 per year (Including Postage)
Rs. 275.00 per six months
(Including Postage)

All articles, subscriptions and inquiries should be sent to this address.

Editor.
"Bhakthi Prabodhanaya"
265, Deans Road, Maradana,
Colombo 10, Sri Lanka
Tel. : 0112 698 177
Email: bhakthi.prabodhanaya@gmail.com

# තිළිණයකි ජීවිතේ...

හෙළිදරව්ව



ජීවිතය යනු උපත සහ විපත අතර ඇති පරතරයයි. උපදින ඕනෑම ජීවියකු මරණයට පත්වීම සොබාදහමේ පරම සත්‍යයයි. මනුෂ්‍යයකුට, සත්ත්වයකුට සහ ශාකයකට මේ ධර්මතාව පොදු සාධකයකි.

ප්‍රදානය කරන්නා විසින් තමන් කැමති අයුරින්, කැමති ප්‍රමාණයකින්, කිසිදු ඉල්ලීමකින් හෝ අයකරගැනීමකින් තොරව නොමිලේ දෙන ප්‍රදානයකි, තිළිණය. බොහෝ විට අප ඉල්ලා ලබා ගන්නා දෑ අයිති වන්නේ ආධාර, වන්දි, බෝනස් හෙවත් පාරිතෝෂිකය යන කුලකයටය. ආධාර දෙන්නේ නැතිබැරිකම නිසාය. වන්දියක් දෙන්නේ කිසියම් අලාභයක් හෝ පාඩුවක් වූ විටය. බෝනස් ලැබෙන්නේ ව්‍යාපාරයක ලාභය පදනම් කරගෙනය. මෙලොවට ඉපදුණ කිසිවකු තම ජීවිතය ඉල්ලා නොමැත. මෙලොවින් යන දවසද නොඉල්ලයි. පාට, හැඩය, ලිංගය, ජාතිය, භාෂාව, ආගම, ප්‍රදේශය, රට, දෙමව්පියෝ, සහෝදරයන් සහ සහෝදරියන් මේ ආදි බොහෝ දෑ අපට ඉල්ලන්නට හෝ තීරණය කරන්නට අවස්ථාවක් කිසිවකුට කිසිදා නොලැබුණි. මනුෂ්‍ය ජීවිතයක් ලැබූ අපි එය ඉතා ආදරයෙන්, ගෞරවයෙන් බාරගත්තෙමු. ලැබූ ජීවිතය දේව තිළිණයක් යන්න අපි අදහමු.

මව්පියන්ටද ඔවුන් කැමති අයුරින් තම දරුවන්ව මෙලොව ජනිත කරන්නට ඉඩ කඩ නැත . දෙවියන්වහන්සේ ප්‍රදානය කරන ජීවිතය මෙලොවට ගෙනෙන්නට ඔවුන් නාලිකාවක් හෙවත් මාර්ගයක් වූවා පමණකි. එබැවින් මව්පියන් තම දූපුතුන්ගේ අයිතිකරුවෝ නොවෙති. භාරකරුවෝ පමණක් වෙති. තමන්ට දාව උපදින දරුවන්ව සුරක්ෂිත කරගැනීම, හදා වඩා ගැනීම, නිවැරදි මාර්ග සඳහා යොමු කිරීම, දෙමාපියන්ගේ වගකීමකි. යුතුකමකි. එය අතපසු කර තමන්ට රිසි අයුරින් කටයුතු කර දහම් හරයන් මගහැර උද්ධච්චකමින් ජීවත් වී දරුවන් නොමග ගිය පසු කිඹුල් කඳුළු හෙළීම අමනකමකි. එහෙයින් කුහකකම හෙවත් දෙබිඩි ස්වභාවය, ආත්මාර්ථකාමීත්වය, අනවබෝධය, විමර්ශනාත්මකව යමක් නිරීක්ෂණය කරගැනීමට ඇති නොහැකියාව, අනිසි කලබලකාරීකම නිසා ප්‍රඥාවන්තව කටයුතු කරන්නට අසමත්වීම, තම ජීවිතයට මෙන්ම අන්‍යයන්ගේ ජීවිත සම්බන්ධව කිසිදු වගකීමකින් තොරව ක්‍රියාකරමින් ඇතැමුන් වචන හසුරුවන අයුරු ඉතා කණගාටුදායකය. හොඳට නරකට දෙකට කටමය කියන්නේ ඒ නිසාය.

බෞද්ධ දර්ශනයට අනුව මනුෂ්‍ය ජීවිතය කෙනකු ලබන්නේ බොහෝ කුසල්වල ප්‍රතිඵලයක් ලෙසය. තමන්ට ඇති අගහිගකම්, ප්‍රතික්ෂේපවීම්, ආදරය අහිමිවීම්, බලාපොරොත්තු සුන්වීම් තුළ වැඩිහිටියන්ට සාපේක්ෂව තරුණ තරුණියන් ජීවිතය නැති කරගැනීමට අද පෙළඹී ඇත. මෙවර

සඟරාවෙන් ඉදිරිපත් කරන "පෙරුම්පුරාගෙන ආ සංසාරේ" යන ගීතය ඉදිරිපත් කරන්නේ සිය ජීවිතය කෝච්චියට පැන විනාශ කරගන්නා තරුණයකු හෝ තරුණියක ගැනය. බෞද්ධ දර්ශනයේ ප්‍රබල පණිවුඩයකි "දුකකිනි මිනිසත්බව ලැබ ගන්නේ කුමටද කුසලට කම්මැලි වන්නේ". මේ ඉර හඳ යට ජීවත්වන අපට ජීවත්වන කෙටි කාලය තුළදී සැබෑ තෘප්තිය, සතුට, සංහිඳියාව විඳ ගන්න මොනතරම් දේවල් තිබෙනවාද යන්න සමහරු අමතක කරති. ඒ නිසාම එය අමතක වන්නන්ට මතක් කර දෙන්නේ "මලක් වගේ රොන් සුවඳ වගේ ජීවිතයේ සුව අපමණ වේ" යන්න ය. ජීවිතයට සැනසීම, සුවය, අභ්‍යන්තර ශාන්තිය ලැබිය හැකි යහපත් ක්‍රම සහ විධි මොනතරම් අප ඉදිරියේ තිබේද යන්න ගීත රචකයා අපට මතක් කර දෙයි. "දොළක් වගේ දිය දෝත වගේ ජීවිතයේ අම සිසිල දැනේ". "දිවිය මොනතරම් සුන්දරදෝ දුකම කොයිතරම් සතුටක්දෝ" යන්න පවසමින් දුක් වේදනාව වුවත් රසයක් බවට පත් කරගන්නට සැබෑ මනුෂ්‍යත්වය ගැන කල්පනා කරන කොයි කාටත් රචකයා ආරාධනා කරන්නේ ජීවිතයේ පරම යථාර්ථයක් මතු කරමිනි.

අපගේ මෙලොව ජීවිතය ඉතා කෙටිය. තාවකාලිකය. නොසිතූ දේ සිදුවන වාර අපමණය. බලය, ධනය, නිලය අත හරින්නට එක් නිමේෂයකින් කාටත් සිදුවිය හැකිය. යහපත සහ අයහපත, හොඳ සහ නරක අතර අපගේ ජීවිත දෝලනය වේ.

යහපත කවදත් අමරණීය වේ. සී. ඩී. ෆොන්සේක තම දියණිය ශර්මිලා ෆොන්සේකා සමඟ ගායනා කරන "සමන් වැලේ මල් ජයට පිපීලා" යන ගීතයේ මෙසේ සඳහන් වේ. "සමන් වැලක් වී පිපෙන් දුවේ ජීවිත මල් ගොමුවේ පරවී හැළුණත් මිනිස් මලේ පවතී සුවඳ ලොවේ".

මිනිසුන්ට හිරිහැර කරන, වගකීම් පැහැර හරින, තළන පෙළන, හොරමැරකම් කරන, මුසා බස් දොඩන, බොරු පොරොන්දු දෙන, අසාධාරණ ලෙස මුදල් ගසා කන ජාවාරම්කරුවන්ගේ ඉරණම බොහෝ අවස්ථාවල අපගේ ඇස් ඉදිරියේම විසඳෙන අයුරු දකින විට අපගේ හදවත් සසල කළත් ඔවුන්ගේ හදවත් ස්වයං විවේචනයකට නොයන්නේ මන්ද යන්න ප්‍රහේලිකාවකි. තමන්ගේ ජීවිතයේ අරුත ක්‍රම ක්‍රමයෙන් වටහා ගන්නා තමන්ගේ ජීවිතය මෙන්ම අන්‍යයන්ගේ ජීවිත ආරක්ෂා කිරීම සහ ඒ ජීවිත ගොඩ නැගීමට අත හිත දීම කිතුනු කැඳවීමේ භාරදූර වගකීමක් ලෙස දකියි.

මනුෂ්‍ය ජීවිතයේ උත්තරීතරත්වය සහ එහි භාරදූර වගකීම පවසන්නට ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මනුෂ්‍යයන් අතර මනුෂ්‍ය ජීවිතයක් රැගෙන මෙලොව වාසය කළ සේක. ක්‍රිස්තුස්වහන්සේගේ දහම් හරය වනුයේ තමන්ට මෙන්ම තමන් සමග සිටින අයටද ප්‍රේම කරන ලෙසටය. මේ ප්‍රේමය ප්‍රායෝගික කරන මිනුම් දණ්ඩ ලෙස උන්වහන්සේ ගෙන හැර පාන්නේ "මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න" (ජොහාන් 13:34) යන්නය. ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමයේ නෛසර්ගික ගුණය ග්‍රීක භාෂාවේ "අගපෙ" යන වචනය හරහා වඩාත් අර්ථවත්ව සහ ප්‍රබලව මතු කරයි. ඒ අනුව කිසිදු කොන්දේසියකින් තොරව සැමට ප්‍රේම කරන්න යන පණිවුඩය ක්‍රිස්තුස් වහන්සේ අපට පවසන සේක.

ජීවිතය නැමැති තිළිණයට වඩා අරුතක් එකතු වන්නේ ක්‍රිස්තු ප්‍රේමය ජීවමාන කරන විටය. එතැන ඇත්තේ බැහැපත්කමකි, පරිත්‍යාගයකි, කැපවීමකි, සමාව දීමකි, සේවක නායකත්වයකි, තේරුම් ගැනීමකි. මනුෂ්‍යත්වයට පමණක් නොව සොබාදහමට ආදරය කරන, ආරක්ෂා කරන සාංඝික ජීවිතයකි. සහජීවනය ඇති කරන ජීවිත ක්‍රමයකි. ජීවිතය නිර්මාණය කළ මැවුම්කරුවාණන්ගේ සැලැස්ම සහ අභිමතය තේරුම් ගෙන ක්‍රියාත්මක වන හැමවිටම ජීවිතය සුරක්ෂිතය. වඩා ඵලදායී ලෙස ජීවත් වී දිනක ජීවිත තිළිණය දෙවියන්වහන්සේගේම දෝතට පිදීම කිතුනු කැඳවීමේ සුලක්ෂණයක් වේ. එවන් දේව ජීවිත ජීවිතයේ මැවුම්කරුවාණන්ව මහිමාලංකාරයට පත් කරයි.

**සංස්කාරක පියතුමා**

# තිළිණයකි මේ ජීවිතේ....



අකාරුණික වදනක් පවසන්නට සිතුණොත් ඔබට අද දවසේ, **කථා කළ නොහැකි කෙනකු ගැන මොහොතක් සිතන්න.**

ඔබ වළඳන ආහාර වේල රස මිදි වග පැමිණිලි කරන්නට පෙර, **වළඳන්නට කිසිවක් නැති කෙනකු ගැන සිතන්න.**

ඔබගේ ස්වාමි පුරුෂයා හෝ භාර්යාව ගැන මැසිවිලි නගන්නට පෙර, **සහකරුවන් පතා දෙවියන්ට කන්නලව් කරන කෙනකු ගැන සිතන්න.**

දුෂ්කර ජීවිතය ගැන අවලාද කියන්නට පෙර, **අකාලයේ දිවි අහිමි වූවකු ගැන සිතන්න.**

ඔබගේ දරුමල්ලන් ගැන චෝදනා කරන්නට පෙර, **දරුවන් නැතිව දරුවකු බලාපොරොත්තු වන කෙනකු ගැන සිතන්න.**

ජරාපත් වූ ඔබගේ නිවස කිසිවකු පිරිසිදු නොකරන්නේ මන්දැයි වාද කරන්නට පෙර, **මං මාවත් දිගේ දිවි ගෙවන අය ගැන සිතන්න.**

ඔබ වෙහෙසට පත්වී රැකියාව ගැන අවලාද නගන්නට පෙර, **රැකියා විරහිත, රැකියා කළ නොහැකි, රැකියාවක් බලාපොරොත්තු වන අය ගැන සිතන්න.**

අනිත් අයට ඇඟිල්ල දිගු කරන්නට පෙර, **අප කිසි කෙනකු නිදොස් නොවන බව සිහි කරන්න.**

පීඩිත සිතුවිලි මගින් ඔබ පහත හෙළන්නට උත්සාහ දැරීම තුළ මුහුණට සිනහවක් නංවා, **තවමත් ජීවතුන් අතර සිටීම ගැන දෙවියන්ට තුති දෙන්න.**

**ජීවිතය තිළිණයකි. එය ජීවත් කරන්න.**

**ගරු විලියම් ඉවාන්ස් පියතුමා**
අදියුරු
සා ඇලෝසියස් දෙව්සත්හල, බොරැල්ල

# ජීවයේ රහස

1953 පෙබරවාරි 28 වෙනිදා එංගලන්තයේ කේම්බ්‍රිජ්හි පිහිටි අවන්හලකට ඇතුළු වූ ක්‍රික් සහ වොට්සන් නමැති විද්වත්හු "අපි ජීවිතයේ රහස සොයාගතිමු" යි කියමින් DNA අණුව සහ එහි ක්‍රියාකාරිත්වය සොයාගැනීම සැමරූහ. මෙතෙක් විද්‍යාත්මක දෑසට අසුනොවූ සෛලයේ තොරතුරු ගබඩා කිරීමත්, පිටපත් කරන ආකාරයත් ලොවට අනාවරණය කළේ ජීවයේ රහස එළිදරව් කිරීමක් ලෙසයි. මීට ශතවර්ෂයකට පෙර පරිණාමවාදය ගැන හෙළිදරවු කළ චාල්ස් ඩාවින්ටත්, ජාන පිළිබඳ මුල්ම පරීක්ෂණ කළ ඔස්ට්‍රියානු ජාතික ග්‍රෙගරි මෙන්ඩල් පියතුමාටත් මෙය අතිශයින්ම සතුට දනවන කරුණක් වනවා නොඅනුමානය. එහෙත් ජීවයේ රහස DNA කෘත්‍යයට පමණක් සීමා කළ හැකිද? දරුවා දෙමාපියන්ගේ බාහිර සහ අභ්‍යන්තර ස්වරූපය උරුමකරගන්නවා සේම ඔවුනට වඩා වෙනස් පුද්ගලයකු බවට පත්නොවන්නේද? මේ ජීවය ප්‍රඥාවේ ප්‍රතිභාව ලැබූවක් නොවේද? එය යහපත සහ අයහපත තෝරාගත හැකි විඥානයක ආභාසය ලැබූ පද්ධතියක් නොවේද? එය නව දැනුම උත්පාදය කරන නිර්මාණශීලී, ආකර්ෂණීය තත්ත්වයක් නොවේද? එය "වැලිකැටයකින් ලෝකය දැකිය හැකි" (විලියම් බ්ලේක් කවියාගෙන් උපුටාගත්තකි) දෑසක් සහිත පුදුමාකාර නිර්මාණයක් නොවේද? ජාන සංස්කරණයට ලක්වන මෙවන් කලක ජීවිතේ රහස ගැන තව දුරටත් අර්ථ දැක්වීම වැදගත් යැයි සිතමි.

1943 දී ශ්‍රොඩින්ගර් නමැති භෞතික විද්‍යාඥයා "ජීවිතේ යනු කුමක්ද?" මැයින් පොත් පිංචක් එළිදක්වන ලදී. DNA සොයා ගැනීමටත් පෙර මේ විද්වතා සෛල තුළ කේත-පිටපත් කිරීම (Code–Script) පිළිබඳව කරුණු දක්වා ජීවයට ස්වයං-සංවිධානය (Self-Organization) වීමේ හැකියාව හඳුනාගත්තේය. ඉතාම කුඩා බැක්ටීරියා තුළත්, සංකීර්ණ මනුෂ්‍ය ජීවය තුළත් මේ ස්වයං-සංවිධානය ක්‍රියාත්මක වෙයි. මෙහිදී යම් පද්ධතියක් ජීවත්වන පරිසරය ස්වයං-සංවිධානයේ හවුල් කරුවෙකි. ලෝකය නමැති විශාල පද්ධතියෙහි ජීවත් වන ජීවීහු, සම්බන්ධතාවන්, ක්‍රියාන්විතයන්, ඓතිහාසික සිදුවීම්, විපර්යාසයන් මෙනයින් ජීවයේ රහසට අනුබද්ධිත කොටස්කරුවෝ බවට පත්වෙති. එක් කුඩා පවුලක සිදුවීමක් මේ විශාල ලෝකයේ පාරිසරික කොටසක් බවට පත්වෙයි. ජීවීන් දක්වන අනුවර්තනයවීමේ ගුණාංගයත් මේ පරිසරය තුළ උද්ගත වේ. එබැවින් මිනිසා මේ අති විශාල පද්ධතිය තුළ ස්වයං-සංවිධානය වන තවත් අද්විතීය, ආකර්ෂණීය ජීවියෙකි.

සැබැවින්ම මිනිස් ජීවිතය පුදුමාකාර ආකර්ෂණීයයි. තාරකා ධූලිවල මූලද්‍රව්‍යවලින් ගහන වූ මිනිස් සිරුර තුළ ඔහුට/ඇයට ආධ්‍යාත්මික දේ ප්‍රවේශ කිරීමට ඇති හැකියාව මේ ආකර්ෂණීයත්වය තවත් උද්දීපනය කරයි. කර්ල් රානර් නමැති දේවධර්මාචාර්යවරයා පෙන්වා දෙන ආකාරයට දේව වරප්‍රසාදයෙන් මේ මුළු මැවිල්ලම ධෝවනය වෙයි. දේව ස්පර්ශයෙන් ධෝවනය වන පරිසරය තුළ ස්වයං-සංවිධානය වන මිනිසා එම ස්පර්ශයෙන්ම පහස ලැබුවෙකි. මෙයයි ජීවයේ රහස. එබැවින් දෙවියන් සහ මිනිසා අතර සම්බන්ධය ගැඹුරු විය. ආධ්‍යාත්මික ගවේෂණ තුළ තම විඥානය (Consciousness) තියුණු විය. ජීවයේ රහස පරපුරෙන් පරපුරට කාලාන්තරයක් තුළ පරිණාමයට ලක්විය. තාරකා ධූලි මිනිස් සිරුරේ ප්‍රධාන සංඝටකයක් සේම දේව ස්පර්ශයත් අපගේම කොටසක් බවට පත්ව ඇත. මිනිසාට දේව ස්පර්ශයෙන් තොරව තම පරිසරයෙන් මිදුණු අයකු විය නොහැකිය. මන්ද මිනිස් පරිණාමය මේ පරිසරය තුළම සිදුවන ස්වයං-සංවිධානයේ ප්‍රතිඵලයක් බැවිනි. මෙයයි ජීවයේ රහස, එහි ආකර්ෂණීයත්වය.

මේ පරිසරය තුළ මිනිසා ඉතිහාසයෙන් පන්නරය ලබන ජීවියෙකි. මීට වර්ෂ ගණනකට පෙර ඇති වූ ඓතිහාසික විපර්යාස අදත් අප මිනිස් ජීවිත වෙනස් කරනු ඇත. වත්මන් ලෝකය දෙස විපරම් කර බලමු. වර්ණ භේදය තුරන් කරන්නට වෑයම් ගත් ඇමරිකානු ජනාධිපති ඒබ්‍රහම් ලින්කන්ට 1865 ඒ වෙනුවෙන් දිවි පුදන්ට සිදුවිය. ඊට ශතවර්ෂයකට පසු සිවිල් අයිතීන් වෙනුවෙන් පෙනී සිටි බැප්ටිස්ට් ක්‍රිස්තියානි

පූජකතුමකු වූ මාර්ටින් ලූතර් කින් (ජූනියර්) හට ද ඒ ආකාරයටම ජීවිතය අහිමි විය. කළු ජාතික ඇමරිකානුවන් අදටත් වර්ණ භේදය නිසා පීඩා විඳින නමුදු නීතිමය හා සමාජීය වෙනස්කම් ගණනාවක් මනුෂ්‍යත්වය ගොඩ නගා ඇත. "කළු ජීවිත වැදගත්" (Black Lives Matter) නමැති සමාජ මෙහෙයුම අදත් කළු ජාතික මිනිස් අයිතිවාසිකම් වෙනුවෙන් සිහින මවයි. ඒවා ක්‍රියාත්මක කරයි. දේව ස්පර්ශයෙන් ලැබූ විමුක්තිය ගෙනෙනා ජීවයේ රහස සමාජ පරිණාමයකට යොමු කරයි.

මඳකට කතෝලික සභා ඉතිහාසය ද පිරික්සා බලමු. 1883 දී ඇන්ටෝනියෝ රොස්විනී පියතුමා ශුද්ධවූ සභාවෙ වණ කැළැල් පහක් ගැන අදහස් පළ කළේය. දුප්පතුන්ගේ වැදගත් කම අමතක කිරීම, සභා ධුරාවලිය (Hierarchy of the Church) කෙරෙහි දැඩි අවධානයක් යොමු කිරීම, "එක්ලීසියානු කේන්ද්‍රවාදය" (Ecclesiocentrism), ක්‍රිස්තියානින් අතර බේදීම සහ ක්‍රිස්තියානි ධර්මයේ "හෙලනීකරණය" (Hellanisation) යන කැළැල්වලට අවධානය යොමු නොකර දෙවන වතිකානුවේ රහස සොයාගැනීමට නුපුළුවන් බව ඉංග්‍රීසි ජාතික ජේසු නිකායික මයිකල් කැම්බල් පියතුමා වරක් මා සමග ප්‍රකාශ කර සිටියේය. ශුද්ධෝත්තම ප්‍රැන්සිස් පියාණන් ගොඩනගන දුප්පතුන් කේන්ද්‍ර කොටගත් ශ්‍රාවකත්වය අද කතෝලික අප සැමගේ හදවත්වල ජීවයේ රහස සමග මුසු වේ. මේ ආකාරයෙන් ඉතිහාසය සහ එහි වෙනස්වීම් අදටත් මිනිස් අපව දිගින් දිගටම නිර්මාණය කරයි. අපව මෙහෙයවයි. මෙනයින් බලන කල අප පරිසරය තුළ අපට නොපෙනෙන දේවත්වයේ යථාර්ථ ජීවයේ රහස තුළ ගැබ්ව ඇති බවත් අපව අනුවර්තනයකට හා පරිණාමයකට ගෙන යන බවත් සහ එමගින් දෙවි-මිනිස් සංවාදය විකාශනය වන බවත් නිසැකවම අපට වැටහී යයි.

දෙඅතේ ස්පර්ශය ලබන මැටි පිඬ අලුත් ස්වභාවයක් ලබන්නා සේම මිනිස් අපිදු දේව ස්පර්ශය ලබමින් ජීවයේ රහසේ පංගුකාරයන් ලෙස වැඩෙමු. තවකුගේ ජීවිත කථාවක්, කිවිඳකුගේ පද පෙළක්, ප්‍රඥාවන්ත කියමනක් මිනිස් ජීවිතය ස්පර්ශ කරයි. එමගින් නව ජීවිතයකට මඟ එළිකරයි. ජීවයේ රහස විකාශනය වේ. එහෙත් කුඩා පූප කැබැල්ලකට මෙවන් ස්පර්ශයක් උත්පාදනය කළ හැකිද? ජේසුස්වහන්සේගේ ජීවිතය ස්වර්ගයෙන් පහළ වූ පූපයක් ලෙස ශුද්ධවූ ජුවාම් තුමා දකී. තමන්වහන්සේව පාවාදීමට පෙර අවසන් රාත්‍රි භෝජනයේදී උන්වහන්සේ තම ගෝලයින්ගේ පාද සෝදමින්, පූප කඩා බෙදා දෙමින් ජීවයේ රහස මුළු ලෝකයම පෝෂණය කරන කැඩෙන පාන් ගෙඩියකට සම කළ සේක. මේ ජීවයේ රහස සහ ස්පර්ශය අප ජීවිත හා මුසුව වැඩෙයි. සාමය ගොඩනැගීම වෙනුවෙන් සිය වතාවකට වඩා සිරබත් කෑ ඇමරිකානු ජාතික ජේසු නිකායික දනියෙල් බෙරිගන් පියතුමා තම ජීවිත අත්දැකීම කවි පදයකට මුමුනා මෙසේ කියයි.

ජීවිතයේ කවදා හෝ කුසගින්නෙන් පෙළෙන
එක මිනිසකුගේ මුහුණ
අවසානයේ දී පාන් ගෙඩියක් ලැබෙන විට
ඔබ දකිනු ඇතැයි සිතමි.
ඔබම එය පුලුස්සාගෙන හෝ
මිලදී ගෙන හෝ
මුහුන් කොට පිළිසකර කර හෝ
තිබිය යුතුයැයි සිතමි.

ඔහුගේ මුහුණේ ඇති ඒ බැල්මට
පාන් කැබැල්ලක් හරහා
ඔහුගේ දෑස් හමුවීමට,
ඔබට බෙහෝ දේ අහිමිවීමටත්,
බොහෝ දුක්විඳීමටත්,
තරමක් මිය යාමටත් පවා,
ඔබ කැමති වනු නොඅනුමානය.

11 වන පිටුවට.....

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ හිටපු
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
**ගරු සුමෙත් පෙරේරා ජේ. නි. පියතුමා**

# තහනම් වෘත්තිකයාට වූ ඇබෑද්දිය

වෛද්‍යවරයකු ලෙස හා ප්ලාස්ටික සැත්කම් වෛද්‍යවරයකු ලෙස වර්ෂ ගණනාවක රෝහල් සේවයේ දී, හද කම්පා කරන සිදුවීම් එමට ය. දිනක්, මා හට කාන්තා හඬකින් ඇමතුමක් ලැබුණි. ඒ දුක සැප විමසීමට ය. මා හට කොරෝනා වැළඳි ඇති බවත්, මාගේ වෘත්තීය සගයා කොරෝනාවෙන් මිය ගිය බවත් රෝහල පුරා පැතිර යාම නිසා මට හුස්ම ගැනීමට අපහසු වූයේ කොරෝනා නිසා නොව, දුරකතනයට අපහසුවෙන් උත්තර බැඳීම නිසාය.

ඩෙල්ටා ප්‍රභේදය නිසා තරමක් අසීරු වූ මම රුදුරු ඇදුම රෝගය ඇති නිසාදෝ තව තවත් පශ්චාත් කොවිඩ් සින්ඩ්‍රෝමයෙන් පීඩා වින්දෙමි. ඇමතුම ආවේ තහනම් වෘත්තියක යෙදුණ කාන්තාවකගෙනි. සරලව කිවහොත් ඕ නගරසෝබනියකි. එහෙත් වෛද්‍යවරයකු වශයෙන් මට එය අදාළ නොවේ. අප හමුවට පැමිණෙන රෝගියාගේ රෝග ඉතිහාසය විනා ජීවිත ඉතිහාසය විමසීම අපෙන් සිදු නොවෙයි. ඇය පෙර දිනක ඇසිඩ් ප්‍රහාරයකට ලක්වීමෙන් මා හමුවට පැමිණියේ ප්‍රතිකාර සඳහා ය. මා ද කොරෝනාවට ගොදුරු වූ බව ඇයට කෙසේ හෝ දැනගන්නට ලැබී ඇත.

''අනේ දොස්තර මහත්තයෝ, ඔබතුමාට දූන්ම මැරෙන්ඩ බෑ. ඔබතුමාට සෙත් පතලා මම බෝධි පූජාවකුත් තිබ්බා.'' යැයි ඇය පැවසුවාය.

මා වෛද්‍ය ශිෂ්‍ය අවධියේදී පවා ප්‍රථම දිව්‍ය සත්ප්‍රසාදයේදි ලද කුරුසිය ගෙලේ දමාගෙන සිටින විට සමකාලීනයන් පැවසුවේ, 'මූදුකරේ කරා කොල්ලා' කියායි. ඒ කුරුසිය තවමත් මගේ ගෙලේ ඇත්තේ පුංචිකාලේ වූ විශ්වාසය නිසා පමණක්ද කියා මට නොවැටහෙයි. මේ නිසා වෘත්තීය දිවියේදී සමහර අන්‍යාගමික වෛද්‍යවරු මාව උපහාසයට ගෙන ඇති වාර ද අපමණය. ඉතින් ඇගේ බෝධි පූජාව මා උපේක්ෂාවෙන් බාර ගත්තේ ඇගේ විශ්වාසයටත් මා ගරු කළ යුතු නිසාය.

''තෙරුවන් සරණයි'' කියා මම දුරකථනය විසන්ධි කළ විට මට සිහියට ආවේ ඇගේ කතාවයි.

මට ඈ මුල් වරට මුණගැසුණේ ශල්‍යාගාරයේ දී ශල්‍ය ඇඳ මතයි. සුන්දර මුහුණකට හිමිකම් කිව හැකි රූප ලක්ෂණ සිතා ගැනීමට හැකිවූ ඇගේ මුහුණ ඇසිඩ් ප්‍රහාරයකින් දැඩි ලෙස විකෘත වී තිබුණි. ශල්‍යාගාර වෙද සායනය මත සිහි නැති කිරීමට පෙර ඇය මට දොහොත් මුදුන් දී වැන්දාය.

''අනේ බුදු සර් මට ආපහු රස්සාව කරගන්න පුළුවන් වෙන්ඩ මූණ හදා දෙන්ඩ.'' ''හරි මට කරන්ඩ පුළුවන් හොඳම දේ මම කරනවා.''

මම ඇගේ හිත හැදෙන පරිදි කතා කළේ වෛද්‍යවරයකුගේ කාර්යයෙන් ඔබ්බට ගිය සාධුවරයකුගේ මානසිකත්වයෙනි. එය අසා සිටි අවට අය කට කොනට සිනා නඟා ගත්තේ උපහාසයට බව මැදිවියට ආසන්නව සිටි මට නොහැඟුණා නොවේ. මා ඇගේ රැකියාව නොවිමසූ අතර මා හැම විටම පැවසුවේ,

''මගේ උපරිම ශක්ති ප්‍රමාණයන් මේ ඔපරේෂන් එක මා කරනවා. තමුනුත් සුවවෙනවාය කියන විශ්වාසයෙන් මට සහය දෙන්ඩ.'' ජේසුස් වහන්සේ සැමවිටම විශ්වාසය සහ සුවය ඒකාබද්ධ කළ බව මම තරයේ විශ්වාස කළ නිසා මගේ මුවින් එවන් වදන් පිටවූයේ ය.

ශල්‍යකර්මයට පැය කිහිපයක් ගතවිය. රෝගියාට සිහිය එනවිට මා නැවත අදාළ උපදෙස් දී ඇගේ විශ්වාසය තිර කළ අතර, ඇයව දිරි ගැන්වූයෙමි. ඈ මට කිසිත් නොපවසා, ශල්‍ය සයනය මතම කඳුළු සැළුවාය. ඇයගේ ඊළඟ ශල්‍යකර්මය යෙදී තිබුණේ තවත් සතියකිනි. මේ ආකාරයට මාස තුනක් පුරා ඇයට ශල්‍යකර්ම රැසකට මුහුණ දීමට සිදුවිය. ඉන් පසු ඇයට නිවසට යාමට හැකි සුදුසුකම අපි සපිරීමු.

එක් දිනක ඇයට සමාන රූපකායක් තිබුණු නව යොවුන් තරුණියක් රෝහලේ කොරිඩෝවේ දි මට වැඳ ස්තුතිය ප්‍රකාශ කළාය. මට එය ප්‍රහේලිකාවක් විය.

''සර් ප්ලාස්ටික් සර්ජරි එකක් කරල මුහුණ හදල දුන්නෙ මගේ අම්මගෙ. ඒකට පිං සර්.''

මේ පෙර කාන්තාවගේ දියණිය බව මට පසක් විය. රෝගියා රෝහලින් පිටව යාමට පෙර ලියකියවිලි පිළියෙළ කරන අතරතුර, ඇගේ දියණිය මව ද සිටින තැන මට ඉතා සංවේදී කතාවක් කීවාය. විසි හැවිරිදි විශ්ව විද්‍යාල ප්‍රවේශය බලාපොරොත්තුව සිටින දියණිය කථා කරන විට ඇගේ මවගේ දෙනෙතින් කඳුළු රූරා වැටෙන්නට විය.

''සර් මේ මගේ අම්මා තමයි. මට අම්මටයි තාත්තටයි දෙන්නටම ඉන්නෙ මේ අම්මා විතරයි.''

ඇයට නිදහසේ කතාව කරගෙන යාමට මම ඉඩ සැලසුවෙමි. ඇය පැවසූ පරිදි ඇගේ පියා කවුද යන්න මේ දියණිය නොදනියි. එය ඇගේ මව ඇයට පවසාද නැත. එසේම ගමේ ඇය දන සිටියේ ඇගේ මව කොළඹ කාර්යාලයක රැකියාවක් කරන බවයි. එය මේ දියණියගේ පාසලේ මිතුරියන්ගේද දැනුමයි.

''අම්ම සමාජ ශාලාවක නළඟනක් කියල මම දැනගත්තෙ අහම්බෙන් ඇහුණ ටෙලිෆෝන් කෝල් එකකින් සර්.'' ඇය කම්පාවෙන් සිය ආත්ම කථනය කරයි.

ඇය පැවසූ පරිදි මානසිකව කඩා වැටුණ මේ දියණිය එතැන් සිට මව සමඟ දින ගණනාවක් උරණව සිට පසුව සත්‍යය වටහා ගෙන ඇත. සමාජ ස්තරයේ පහළින්ම ඉපිද, සියලු සම්පත් ඇති රටක රට හොරුන්ට හොරුන් කියන්නට සිදුවන්නේ නම් ඇගේ අම්මා ඇයට පත්තිනි මාතාවකැයි ඇය වටහා ගත්තීය.

කථාව අතරතුර මට පැමිණි දුරකථන ඇමතුම් විසන්ධි කළේ ඇගේ භාවයන්ට ඉන් හානියක් සිදු නොවන පිණිසයි. මට වුවමනා වූයේ රෝගී සත්කාරයේ උතුම්ම කොටස වූ රෝගීන්ට සවන්දීම යහපත් ක්‍රියාවක් නිසා ඊට අනුගත වීමටයි. ථේරවාදයටවත්, මහායානයටවත්, ජපානයේ සෙන් බුද්ධාගමටවත් අයත් නොවූ ඇගේ කතාව වෙනම දර්ශනයක් ලෙස මට දැනුණි.

''ඉන්ඩ සර් ඉතුරු ටික මං කියන්නන්'' ඇගේ මවට අවැසි වූයේ එය තමාගේ මුවින් මට ප්‍රකාශ කිරීමටය. ඇය ගමේ තරුණයකු හා මිත්‍රවී තිබුනේ වයස අවුරුදු 14 දීය.

සාමාන්‍ය පෙළටත් නොලියා ඇය ගෙදරින් වහන්ව යන්නේ ඔහු පිළිබඳ තිබූ ප්‍රේමය නිසාය. ටික කලකින්ම ඇය දියණියට මවක වන නමුත් ඒ වන විට ඇගේ ප්‍රේමවන්තයා ඇය හැර ගොසිනි. සිඟිත්තියක ද සමඟ යන එන මං නොදන දිවි කතරේ අතරමං වන ඇගේ පිහිටට එන්නේ මොරටුව රාවතාවත්තේ තෙරේසා මව්තුමියගේ නිකායට අයත් පැවිදි සොහොයුරියන් ය. ඉන් ටික කලකට පසුව පැවිදි සොහොයුරියන් මේ සිඟිත්තිය සිය දෙමාපියන්ට බාර දී ඇත.

ඇගේ පියා වැලිමඩ අර්තාපල් ගොවියකු වන අතර අත්තම්මා සිඟිත්තිය බලා කියා ගත්තාය. ඇයට යළි කොළඹ හාදයකු මුණගැසෙන්නේ මේ දිවි ගමන අතරතුරේ දීය. ජීවත් වන මඟක් සොයන ඇය ඔහු මාර්ගයෙන් කොළඹ සමාජ ශාලාවක රැකියාවට සම්බන්ධ වූවාය. ගෙදරට හා ගමට ඇය බැංකු සේවිකාවක් වන අතර සති දෙකකට වරක් ගමට එයි. ගෙදරට අවැසි කළමනා හා මුදල් ඈ සපයන අතර මෙසේ දින සති මාස ගෙවී ගියේය. ඇගේ පියාට අක්කර දෙකක පමණ ඉඩමක් අල වගාව සඳහා ලැබුණි. ඒ නිසා ඇගේ මව ඉඳහිට එළවළු වතුවල කළ කුලී වැඩද නතර විය. දියණිය ශිෂ්‍යත්වය සමත්ව බදුල්ලේ ප්‍රධාන විද්‍යාලයකට ඇතුළු වූ අතර ඉහළ පෙළේ උපාසිකාවක වූ ඇගේ මවට පන්සලේ කඨින චීවර පූජාවේ ප්‍රධාන දායිකා තනතුරද ලැබිණි. මේ කාලයේදී ඇය දෙවරක් තම මාපියන් දඹදිව වන්දනාවේ රැගෙන ගියාය. එසේම ගමේ පින්කම් කිහිපයක්ම සම්පූර්ණ කළේ සිය මවගේ සතුට වෙනුවෙනි.

15 වන පිටුවට.....

**වෛද්‍ය සචිත මිලින්ද මෙන්ඩිස්**
ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරී උ.කො.
ශික්ෂණ රෝහල
රාගම

# පරිසරය සුරකිමුද? එක්ව වැනසෙමුද?

පරිසරය කියන්නේ මොකක්ද? පරිසරය යනු ස්වභාව ධර්මයයි. තවදුරටත් කිවහොත් මනුෂ්‍ය වර්ගයා ජීවත් කරලීමට දෙවිපියාණන්වහන්සේ විසින් නිර්මාණය කරන ලද මහා බලවේග යකි. ඉතින් අප පරිසරයට ගෞරව කරන විට නොදැනුවත්වම දේව තාත්තාටද ගෞරවය කිරීමක් වන්නේය. එබැවින් දිවි දෙවැනි කොට සොබා දහම රැකීමට අපි සැම බැඳී සිටිමු. ඇත්තෙන්ම පරිසරය අපේ හුස්මයි. දැනුවත්ව හෝ නොදැනුවත්ව පරිසරයට වින කරන්නා ඒ ආකාරයටම මිනිස් ජීවිතයටද වින කරන්නෙකි. එසේ කරන්නා තමන්ගේ වළ තමාම කපා ගන්නා පමණක් නොව අන් අයගේ වළවල්ද කපයි.

දැන් දැන් ලෝකයේ මෙන්ම අප රටේද පරිසරය ගැන විශාල වශයෙන් කතාබහ කෙරේ. බොහෝ කතා හුදු ප්‍රලාප පමණකි. මිනිස් දිවියේ වටිනාකම දන්නෝ නිතරම පරිසරය ගැන සොයා බලති. එසේ නොදන්නෝ මහා පරිමාණයෙන් පරිසරය විනාශ කරති. එසේ කරන්නේ සංවර්ධනය සඳහා බවත් ඉන් ඇතිවන ප්‍රතිලාභ ඉමහත් ය යනුවෙන් පුහු තර්ක ඔවුහු ඉදිරිපත් කරති. එහෙත් කඩිනම් සංවර්ධනයට වඩා ක්‍රම ක්‍රමයෙන් මිනිසාත් රටත් හුස්ම හිරකරන තත්ත්වයට පත්වන බව ඔවුනට නොවැටහේ. වැටහුණද ඒ බවක් නොපෙන්වා ළදරුවන්සේ හැසිරෙමින් තම මඩියට ගලා හැලෙන මුදල් කන්දරාව දෙස ගිජු ලෙස බලා සිටියි. මීගමු කලපුවේ කඩොලාන විනාශ කරමින් ඇරඹීමට සූදානම් වූ සංචාරක ව්‍යාපාරයකට ඒ පලාතේ ධීවරයන්වද සම්බන්ධ කරගනිමින් මැති ඇමති වරු සහ නිලධාරි පිරිසක්ද සමග සාකච්ඡාවක් පැවැත්විණ. මහත් ආන්දෝලනාත්මක වාද විවාද මැද එක්තරා පරිසර නිලධාරිනියක් මෙයින් වන විපත සංවර්ධනයට වඩා මිනිසාට ඉතාම අහිතකර බව අගමුල ඇතිව පැහැදිලි කර දුන්නාය. එපමණක් නොව ඒ නිලධාරිනිය මේ ව්‍යසනය කිසිසේත්ම අනුමත කිරීමක් නොකරන බවත් වහාම මෙය අත්හිටුවන බවත් අභීතව ප්‍රකාශ කළාය. මහා පුටුවල සිටි බලධාරින්ට කරකියාගත හැකි දෙයක් නොවීය. එසේ වූයේ අනාගත සත්‍යය උදාහරණ සහිතව පෙන්වා දුන් බැවිනි. උත්තමයන්ට කට උත්තර නැති වූ අතර ව්‍යාපෘතිය එතැනම ලොප් විය.

දැන් නැවතත් මුතුරාජවෙල සංවර්ධනය යයි කියමින් තවත් බලගතු ව්‍යාපාරිකයෙක් ඒ පලාතම විනාශ කරමින් මහා පරිමාණ ඇළදොළ හා වනය විනාශ කරමින් සිටී. ඒ සඳහා අවසර ලබාගත්තායයි ප්‍රකාශ කළද එවැන්නක් සිදුවී නොමැති බව අදාළ අමාත්‍යාංශය කියා සිටියි. මෙය අපභ්‍රංශයකි. කවුරු බොරු කියනවාදැයි නොදනිමු. මුතුරාජවෙල කියූ සැණින් ඒ නමින්ම අතීතයේ මේ ප්‍රදේශය කෙලෙස තිබෙන්නට ඇත්දැයි සිතාගත හැකිය.

මේ විනාශය කාලයක පටන් මඳ වශයෙන් කෙරෙමින් තිබුණද දැන් දැන් එය විශාල ලෙස කෙරෙන බවක් දක්නට ඇත. බහුතරයක් කතෝලිකයන් වසන මේ ප්‍රදේශයේ ජනතාව දැන් කතෝලික සහා මූලිකත්වයද සමග දැවැන්ත විරෝධයක් ගොඩනගා ඇත. මීසම්වල ගරු පූජකතුමන්ලා, මීසම් වාසීන්ද එකතු කරගෙන උද්ඝෝෂණ ව්‍යාපාර සිදුකිරීම ඇත්තෙන්ම රටට හිතකර නැති බව කෙනකුට පැවසිය හැකිය. එහෙත් අදාළ ප්‍රශ්නයට බලධාරීන් කන්නොදෙන්නේ නම් අවැසි පියවර ගැනීමට වුවමනාවක් නැතිනම් මහජනතාවට බලපා ඇති දැවෙන ප්‍රශ්නයට කඩිනම් විසඳුම කුමක්ද? සුළු පිරිසකට මුදල් හම්බ කරන්නට රටක ස්වාභාවික පරිසරය විනාශ කරන්නට පියවර ගන්නා වත්මන් බලධාරීන්ට මේ ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ දැඩි පිළිකුල හා විරුද්ධත්වය ප්‍රකාශ කරන මේ උද්ඝෝෂණවලට වගකිවයුත්තන් බලධාරීන් සංවේදී වනවා මිස ජනතාවගේ හඬ සහ විරෝධය මර්දනය කරන්නට යාම ඉතාමත්ම අමන ක්‍රියාවකි. එබැවින් මුදලට මිල කළ නොහැකි මිනිසාට අවශ්‍ය ඔක්සිජන් නිපදවන්නේ මෙකී වනාන්තර තුළින් බව අප අමතක නොකළ යුතුය. මෙය නැතිවී ගියහොත් ආශ්වාස ප්‍රශ්වාස කිරීමට මාර්ගයක් නැතිව මිනිසා මියැදෙනු ඇත.


මේ නිසා මෙවන් විරෝධතාවලට සහයෝගය දැක්වීම අත්‍යවශ්‍යම වේ.

සිංහරාජ වනාන්තරයටද මේ ගස්පාලුවන් අත ගසා ඇති බව දැකගන්නට ඇත. ඒකත් කරන්නේ සංවර්ධනය නාමයෙන් ය. දැනටමත් වටිනා ගස් පෙරළා ලී මඩුවලට යවා ඇත. ගස් පමණක් නොව ලංකාවට ආවේණික මත්ස්‍ය වර්ග, කුරුලු ආදි සතුන්, මල් වර්ග දැනටමත් අතුරුදන් වී ඇත. අලි ඇතුන්ද එසේමය. පරිසර හිතකාමී මේ කරුණු අරබයා විරෝධතා දැක්වුවද පෙළපාලි ගියද මැති ඇමැතිවරු නිදහසට කරුණු කියමින් වහසි බස්ද දොඩති. ඉහළ අහසේ දෙවියෝ මීට උත්තර දෙනු ඇත්තෝය. මේ අතින් බලන විට කිතු දන පුබුදුව නිර්මාතෘ ගරු සිරි ඔස්කා අබේරත්න පියතුමා කදිම ආදර්ශයක් කාලාන්තරයක් සිටම ගෙන එයි. එතුමා සිය පූජක දිවිය පුරා සොබා දහමට ලොල් වූවෙකි. එතුමාගේ මූලිකම අණ පණත වූයේ වල්පොල ප්‍රශංසාරාමයට මෙන්ම පුබුදු ව්‍යාපාරයට අයත් හැම භූමියකම ගස් කොළන් සුරැකීමයි. පාරක් තොටක් එළි පෙහෙළි කිරීමකදී වුවත් අත්‍යවශ්‍ය යැයි හැඟුණොත් මිස එතුමාගේ අධීක්ෂණය මත ගහක අත්තක් කැපිය හැකි වේ. සෑම ගහකටම අත්තකටම, කොළයකටම ජීවයක් ඇති බව උන්වහන්සේ පැවසූ සේක. මොනයම්ම ජීවිතයක් විනාශ කරන්න එපා යනුවෙන් එතුමා තරයේ පැවසීය. එතුමාව අනුගමනය කරන්නේ නම් යහපති.

මේ කරුණුකාරණා මගින් පරිසරය සුරැකීම අපගේ පරම යුතුකම වේ. ගහට, කොළට අප ආදරය කළ යුතුය. දෙවියන් වහන්සේගේ සුන්දර මැවිලි මිනිසා විනාශ නොකළ යුතුය. මෙය ළදරු කාලයේ සිටම අවබෝධ කර ගත යුතුය. එවිට අපට නිදහසේ ආශ්වාස ප්‍රශ්වාස කළ හැකිවේ. දැන්වත් අපි මීට ඒකරාශි වෙමු. දෙවියන්වහන්සේ දුන් මේ සුන්දර භූමිය සුරකිමු.

**කේ. ඒ. රෝලන්ඩ් ලෙස්ලි**
කඳවල

## අමිතගේ හද ගැස්ම......




ජීවයේ රහස... 7 වන පිටුවෙන්.....

දෙවියන් තුළ නිර්මාණය වූ මිනිසා ජීවයේ රහස දෙමාපියන්ගෙන් දරුවන්ටත්, තවත් සමාජයකටත්, අලුත් පරපුරකටත්, නව ලෝකයටත් විකාශනය කරයි. පදාර්ථයේ රසායනික බන්ධන සමඟ අධ්‍යාත්මයේ සම්බන්ධතා මුසුව ගොඩනැගෙන ජීවයේ රහස ස්පන්දනයෙන් විඥානය උපදවන, ජීවිත වෙනස් කරවන, අත්දැකීම්වලින් පන්නරය ලබන, ජීවනය දෙන, දේව සංවාදයට අවදිවන දේව ස්පර්ශයම වේ. මේ නිසාම මිනිස් ජීවිතය ආකර්ෂණීය වේ. මිනිස් ජීවයේ රහස පියවරෙන් පියවර පරිණාමයට ලක්වෙමින් ඇසට නොපෙනීම ඔබත් මාත් සමඟ දේව රාජ්‍ය ගොඩනගයි. එයයි අපේ එකම බලාපොරොත්තුව. එයයි ඥානවන්තයන්ගෙන් හා උගතුන්ගෙන් වසන් කළ, බාලයන්ට එළිකළ (මතෙව් 11 : 25) ජීවයේ රහස.

# නිදහස වගකීමකි



ලෝවැසි හැම දෙනෙක්ම නිදහසට කැමැත්තේය. ජීවිතයේ බොහෝ අවශ්‍යතාවලට නිදහස වුවමනාය. ජීවත්වීමේ නිදහස ඉන් ප්‍රධාන තැන ගනී. චින්තනයේ නිදහස ශ්‍රේෂ්ඨ ජාතියක් බිහි කරයි. ජීවත් වීමට බොහෝ දේ අවශ්‍ය වේ. ඒ අවශ්‍යතා නොලැබුණ විට ඒවා ගැනීමට ඉල්ලීම් කළ යුතුය. ඉල්ලීම් නොලැබුණ විට සටන් වදිනු ඇත. නිදහස පතා විප්ලවීය අරගල ඇතිවන්නේ වගකීම් දරන්නන්ගේ ඒකාධිපති පාලනාධිකාරිය නිසාය. රාජ්‍යයන්, ජාතීන්, ආගම් සම්බන්ධව නිදහස් අරගල 17, 18 වන ශතවර්ෂවල බහුලව සිදුවී ඇති බව ඒ ඒ රටවල ඉතිහාසය සාක්ෂි දරයි. ප්‍රංශ විප්ලවය ඒ අතුරින් ප්‍රමුඛත්වය ගනී. යුරෝපීය රටවල හා ඇමරිකාවේ ප්‍රාන්ත අතර නිදහස අරබයා ඇතිවූ අරගල ප්‍රංශ විප්ලවයේ සාධනීය ප්‍රතිඵලයයි.

උත්පත්ති පොතේ සඳහන් පරිදි ලොව මැවූ දෙවියන්වහන්සේ මිනිසාගේ ආහාරය ලැබීමේ නිදහස ප්‍රථමයෙන් ප්‍රදානය කළේ මෙසේය. "මිනිසාගේ ප්‍රයෝජනය සඳහා දැකුම්කලු ප්‍රණීත එල දෙන සියලු ගස් භූමියේ හට ගන්වා, හොඳ නරක අවබෝධ කිරීමේ ගස හැර අනික් සියලු ගස්වල ගෙඩි අනුභව කිරීමේ නිදහස මිනිසාට දුන් සේක" (උත්. 2:16). නිදහස, වගකීමෙන් තොරව පාවිච්චි කිරීමේ විපාක මිනිසා අත්කරගත් අයුරු ශු. බයිබලයේ මැනැවින් සඳහන් වේ (උත්. 3 මිනිසාගේ වැටීම).

අත පය ගසා, හිනැහෙන, නැලවෙන බිළිඳාට ඒ උත්පත්ති නිදහස නොලදහොත්, ඔහුගේ වැඩීම ප්‍රමාද වී රෝගියකු වනු ඇත. එහි වගකීම දෙමව්පියන් මූලිකව දැරිය යුතුය. බිළිඳාගේ වැඩීමට කිරි උරා බීමේ නිදහස, නින්ද ලැබීමේ නිදහස, ආදරය ලැබීමේ නිදහස නිසි වෙලාවට ලබන්ට සැලැස්වීම මූලික මිනිස් අයිතිවාසිකමකි. දෙමව්පියෝ ඒ වගකීම දැරිය යුත්තාහ. බිළිඳා රෙදි කඩමලුවල ඔතා, කටේ සූප්පුවක් ඔබා, ගස් යට හෝ පාළු තැන්වල බාවා, සොච්චම් මුදලක් බලාපොරොත්තුවෙන් බැලමෙහෙවරට යන අම්මලාට දරුවා කෙරෙහි තමන්ට පැවරී ඇති වගකීම ගැන සුළුවෙන්වත් තැකීමක් නැත. දරුවා බෙරිහන්දී හඬා වැටෙන්නේ ආදරය, ආහාරය කලටවේලාවට ලැබීමේ නිදහස අහිමි වූ විටය. හැඬීමේ නිදහස බහුලව භුක්තිවිඳීම නිසා "බාලගිරි දෝෂය - අද නෙවෙයි හෙට" කියා දොරේ ලියා තබයි. ඒ මිථ්‍යා විශ්වාසවලට ඇබ්බැහි වීමේ නිදහසය. පය පොළොවේ ගසා නැගිටින තුරුත්, වැටි වැටී ඇවිදගෙන යන තුරුත්, බහ තෝරන වයසේ හැම ක්‍රියාකාරකමකට ආරක්ෂා සහිත නිදහස දීම වැඩිහිටියන්ගේ වගකීමකි. එය පැහැර හැරීම දරුවාගේ පෞරුෂ වර්ධනයට විශාල බාධාවකි. පාසල් යන වයස එළඹෙන තෙක් ළදරුවාගේ නෛසර්ගික හැකියාවලට බාධා නොකළ යුතුය. වැඩිහිටියන් හැම මොහොතකම දරුවන්ව යොමු කරන "එපා - එපා" යන තහන්චිය දරුවාගේ නිදහස් චින්තනයට බාධාවකි. සමහරවිට දරුවන් හිතුවක්කාර ඉරියව්වලට ඇදී යන්නේද ඒ නිසාය. නොමේරූ ළමා වියේ හටගන්නා හිතුවක්කාර ක්‍රියාකාරකම් දඬුවමින් සීමා කිරීමට දෙමව්පියෝ ක්‍රියා කරති. අවාසනාවට බොහෝ දරුවන් ඊට ප්‍රතිචාර දක්වන්නේ හිතුවක් කිරීම හා අකීකරුකම ප්‍රවර්ධනය කිරීමෙන් ය. "දරුවන් හික්මවා ගැනීමට දඬුවම ප්‍රායෝගික නොවේ. වීරත්වයේ ක්‍රියාකාරකමකට ආදරයෙන් යොමුකරන්න.

හුරුබුහුටි දෑත් දෙපා ඒ වීර ක්‍රියාවට යොමු කරයි. හිතුවක්කාර යොමුව යටපත් වේ යයි ළමා මනස හා ළමා අධ්‍යාපනය ගැන නොමියෙන සේවයක් කළ 'මරියා මොන්ටිසෝරි' මැතිණියගේ වටිනා උපදේශයකි.

තමන්වහන්සේ වෙත ගෙනා ළදරුවන්ව ආදරයෙන් තුරුලු කරගෙන, ඔවුන්ව ආශීර්වාද කරමින්, ජේසුස්වහන්සේ ශ්‍රාවකයන්ට පැවසූයේ, "ළදරුවන්ට මා වෙතට එන්නට ඉඩ හරින්න" කියාය (මාක් 10 : 14 - 16). සුපුවතේ ශු. මතෙව් තුමා මෙසේ සඳහන් කරනවා. "බාලයන්ගෙන් එකකුවත් නොමග යවන යමකු වේද, ඔහුගේ ගෙල වටා මහ ඇඹරුම් ගලක් එල්ලා මුහුදු ගැඹුරෙහි ගිල්වා දැමීම ඔහුට යහපත...." (18 : 6). ආදරයේ උල්පතින් නිදහස හා වගකීමේ ජලධාරා ළදරුවන් වෙත, සරණක් නැති අය වෙත, වියපත් අය වෙත, රෝගීන් වෙත නිදහස ගලා යන්නට සැලැස්වීම මහගු පුණ්‍ය කර්මයකි.

නිදහස උපරිමයෙන් හා අවහිරයකින් තොරව භුක්ති විඳින්නේ මිනිසා නොව සතා සිව්පාවුන් ය. තැන නොතැන නොබලා හඬනැගීම, ශරීර කෘත්‍ය, ලිංගික හැසිරීම, දඹර කරගැනීම ආදී හැසිරීම්වල යෙදෙන්නේ පහත් ජන්ම ගති නිසාය. මෙවැනි දේ කරන මිනිසුන්ව හඳුන්වන්නේ තිරිසනුන් යනුවෙනි. වගකීමක් ඇති මිනිසා තිරිසන් වැඩ නොකරයි. "මම එහෙම කළාට උඹට ඇති රුදාව මොකක්ද?", "කාගෙවත් සල්ලි යෑ මං වියදම් කළේ" නිදහස අයුතු ලෙස භාවිත කරන, වගකීමක් නැති අයකු නිදහසට කියන කතා එලෙසය. අනික් අතට, " නිදහස තිබුණ පලියට තිරිසන් වැඩ කරන්නෙපා" යයි වගකීමක් ඇති කෙනකුගේ අවවාදයයි.

අප රටට නිදහස ලැබී වසර 74 කි. ඒ නිදහස කුමක්ද? හිරු නොබසින අධිරාජ්‍යයේ බල අණසකින් මිදී, තමන් කැමති ලෙස පාලනය වීමේ, වගකීම තමන් පිට පවරා ගැනීමේ දේශපාලනමය නිදහස 1948 පෙබරවාරි 04 දා නෛතික නිදහසක් අපට ලැබිණි. මුලින්ම පෘතුගීසීන්ගේ ආක්‍රමණයෙන් ලංකාව ඔවුන්ගේ යටත් විජිත පාලනයට නතුවීමට පෙර අපි නිදහස්, නිවහල්, ස්වෛරී ජාතියක්ව සිටිමු. ඒ කාල පරාසයේ අපේම රජවරු රට තුළ රාජධානි පිහිටුවාගෙන රට පාලනය කළහ. ඉන්දීය සාගරයේ මුතු ඇටය බවට පත්වූයේ ඒ ස්වෛරී පාලනය නිසාය. ඒ මුතුඇටය අධිරාජ්‍යවාදීන් තුන්ගොල්ලකගේ අතට මාරුවෙන් මාරුවට නතුවිය. ඒ හේතුවෙන් රටේ නිදහස පමණක් නොව පෙර තිබූ ස්වෛරීත්වයත් අපට අහිමි විය. නිදහස් චින්තනය ඇකීමැකී ගියේය. රටවැසියාට නොව සප්ත සයුරෙන් එතෙර සිටි නරපතියකුට වගකියන පාලනයකට යටත් විය. අවසන් යටත් විජිත පාලනයෙන් රට නිදහස් කරගෙන ජාතියට වගකියන පාලකයන් ඉල්ලා දේශප්‍රේමීහු අවිහිංසාවාදී සටනක පෙරමුණ ගත්හ. අසල්වැසි ඉන්දියාවෙත් මහත්මා ගාන්ධි ශ්‍රීමතාණන්ගේ එඩිතර නායකත්වයෙන් නිදහස් සටනට පණපෙවුණි. ප්‍රතිඵලය මල්පල ගැන්විණි. ඉංග්‍රීසින්ගෙන් නිදහස ලැබුණද සුන්දරත්වය නැති ස්වෛරීත්වයක් පමණක් ලැබිණි. කිරුළු පළන් නරපතියකු වෙනුවට අධිරාජ්‍යයේ කිරුළට කත් අදින ආණ්ඩුකාරයකුගේ පාලනයට නතුවිය. නිලමෙලා, අධිකාරම්ලා, රටේ රාළලා, මුහන්දිරම්ලා කටුගෙට යවන ලදහ. ජනතාවට නොව වගකීම ගොඩනැගිල්ලකට (පාර්ලිමේන්තුව) පැවරුණි. කල්යත්ම ඒකීය නිදහස් රාජ්‍යයක් උදෙසා වගකීම පැවරුණ ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ බලසහිත ප්‍රභූන් පිරිසකට රටේ පාලනය පැවරුණි. එවන් නිදහස් දේශයක අප දැන් ජීවත් වන්නේ. එහෙත් ඒ දේශයට හා දේශිකයන්ට වගකීම දැරිය හැකි සුදුස්සන් හඳුනාගැනීම අපේ වගකීමය.

කවර තරමේ අභියෝගයකට වුවත් හිස නොනමන, පක්ෂ - පාට භේදයෙන් තොර, ලැබූ නිදහස පාවා නොදෙන, ධනයට බලයට හිස නොනමන, දේශයේ හා ජනතාවගේ ස්වෛරීත්වය උදෙසා දිවිහිමියෙන් වගකීම බාර ගන්නා, නැණවත් පිරිසකට රටේ පාලනය පැවරීම නිරන්තරයෙන් පුරවැසි වගකීමය.

**එම්. සී. බෙන්ජමින් පෙරේරා**

හොරණ

# පැතුම් පොදි

පුංචි කිරි දසුන් පා - සිනාසෙන විට දී ඔබ
මගෙ හදට මිහිරක් ය දෙන්නේ
හදවතේ දහසකුත් - එකක් කරදර ඇතත්
සියලු දෑ එයින් නිම වන්නේ
මගෙත් අම්මගෙත් ඔබෙ - අනාගත සිහින ලොව
ඔබ තමයි අරාගෙන ඉන්නේ
පුතා මිනිහෙක් ලෙසින් - සමාජෙට ආ දිනයි
අපෙ පැතුමෙ මල් පොකුරු එන්නේ

නොගෙන උඩඟුව හිතට - නිහතමානව ඉඳන්
සිප් සතර හොඳින් ලැබ ගන්න
ගුරු දෙගුරු වැඩිහිටියො - ගරු ඇතිව සලකමින්
රට දැයට වැඩැති ලෙස ඉන්න
හෙළ රටේ පෙර විරුවො - කළ විකුම් හිතට ගෙන
අයුක්තට පා පහර දෙන්න
පුංචි පුතුගෙන් මෙමා - පතන මේ පැතුම් පොදි
රැකදෙන්න හද සිසිල එන්න

"මිනිස්කම" කිසිම විට - හදවතින් ඉවත්කොට
කිසි වැඩක් කරන්නට එපා
අනුන් කරනවට ඔබ - කැමති නැති කිසි වැඩක්
අනුන් හට කරන්නත් එපා
හදට එකඟව සිතා - හරි වැරදි තෝරාගෙන
අනුන් හට කිසිත් අත නොපා
දිවි ගෙවාපන් පුතේ - එයින් ඉදිරි බාධක දුරැර
ඔයින් ඔබෙ හදට එයි සැපා

**සී. ආර්. ඩික්සන් ඇන්ටනි**
පේරලන්ද



තහනම් වෘත්තිකයාට... 9 වන පිටුවෙන්.....

මේ කාලයේ දියණිය බදුල්ල දිස්ත්‍රික්කයෙන් ඉහළම ලකුණු ලබා ශ්‍රී ජයවර්ධන විශ්ව විද්‍යාලයට වරම් ලබා ගැනීම ඇගේ සතුට නිම් හිම් නැති විය. උස් මහත් වූ දියණියක සිටියද තවම අවුරුදු හතළිහකට ආසන්න වූ ඇගේ ලෝකයට දුෂ්ටයකු සමීප වන්නේ ඇගේ රූ සපුවේ ආකර්ෂණය නිසාය.


මුල් කාලයේදි ඇයව සමාජ ශාලාවට සම්බන්ධ කළ පුද්ගලයා දූනට විවාහක දෙදරු පියෙකි. ඔහු නැවත ඇය හා මිත්‍රවන සේ කිහිප විටකදී බලපෑම් කර ඇත. එය හරි නොගිය තැන ඇයට තර්ජනය කර ඇත. මේ නිසා ඇය නීතියේ පිහිට ද පතා ඇත. මා රෝහලට යන එන මාර්ගයේ ඇති මා ඉතා ආදරය කරන සුදුවර චරිතයක් වූ ශාන්ත සෙබස්තියන් මුනි ප්‍රතිමාව අසලදී ඇයට ඇසිඩ් ප්‍රහාරයක් එල්ල වූයේ ඒ පුද්ගලයාගෙනි. ඉන් ඇගේ මුහුණ දැඩි ලෙස විකෘත විය. මේ සිදුවීම සිදුවූයේ පොලිසිය පෙනෙන මානයේ දීය.

සෙබස්තියන් මුනිඳුන් ඉදිරිපිට ඇයට සිදුවූ මේ විපත්තියෙන් මා තවත් කම්පාවට පත්වීමි. මේ ආකාරයටම සෙබස්තියන් මුනිඳුන්ගේ සෙවණ යට දී හස්තුන්ගේ මරාගෙන මැරෙන බෝම්බයට ගොදුරුව දිවි අහිමි වූ අහිංසකයින් 115 දෙනා ගැන ද එවන්ම කම්පාවක් මා තුළ ඇතිවිය. එදා වෛද්‍යවරයෙකු ලෙස බැතිමතුන්ගේ සිරුර පසාරු කරගෙන ගිය යකඩ බෝල පිටතට ගැනීමේ ශල්‍යකර්මවලට මුහුණ දීමට සිදුවිය. එහෙත් මිනිස් සිත්සන්තානයේ මුල බැසගත් වෛරයේ යකඩ බෝල අපි කෙසේ ඉවත් කරමුද ? මා මහත් වෙහෙසින් සකස් කළ ඇගේ මුහුණ වෛරයෙන් මුසපත් වූ පැරණි පෙම්වතා නැවත වතාවක් විනාශ නොකරාවියැයි කෙසේ සහතික විය හැකිද ?

බලාපොරොත්තු සහගත දියණියත්, දුගී දුප්පත් අම්මා, තාත්තා ආඩම්බරකාරයන් කළ මේ දියණියට මේ සමාජයේ පිළිගැනීමක් ඇතිද ? 1980 ජූලි 26 දින උපන් නවසීලන්ත අගමැතිණිය වන ජසින්තා ආඩෙන් හා මගේ කථානායිකාවගේ වයස සමානය. තරුණ ජසින්තා ''නෙල්සන් මැන්ඩේලා සාම සමුළුව'' අමතන්නට නිව්යෝර්ක් නගරයට යන්නේ ඇගේ අලුත උපන් බිළිඳියත් සමඟය. බබෙක් සිටියද ඇය තවම විවාපත් වීද නැත. ඇය සමුළුවට එන්නේ ඇයගේ පෙම්වතා, සහකාරයා, ළමයාගේ තාත්තා, විවාහ වන්නට සිටින කෙනා හෝ වෙන එකම නමක් ඇති ක්ලාක් ගේ ෆෝඩ් සමඟය. ජසින්තා සමුළුව අමතන්නේ ක්ලාක් දරුවා උකුලේ තබාගෙන බලා සිටින අතරය. ක්ලාක් සමුළුවට එන්නේ ඔහුගේ වියදමින් බවත්, ඒ දරුවා බලාගන්නා ලෙස බවත් යැයි ජසින්තා එහිදි ප්‍රකාශ කළාය. මේ ලක්ෂ විස්සක් පමණ සිටිනා, අවුරුද්දෙන් බාගයක් හිරු එළිය ලැබෙන රටේ ඇත්තන්ගේ සමාජ දියුණුවයි. ඉර අවුරුද්දේ හැම දිනකම ඇති අපේ රට ණය ආකරයකි. කළ වැඩක්ද නැත. ජසින්තා වැනි දිරි කතුන් මහමඟ ඇසිඩ් ප්‍රහාරවලට ලක්වන්නේ ඇයි ?

මසකට වරක් ඇය සායනයට පැමිණෙන්නේ ඇගේ මුහුණේ ඉතිරි කැළැල් ද මකා ගැනීමටය. 1979 දෙසැම්බර් 18 වන දින සීඩෝ ළමා හා කාන්තා අයිතිවාසිකම් සුරක්ෂා ප්‍රඥප්තියට අපද එකඟ වී ඇත. ඊට පසු ඉපදුණ ඇයට තවම එය වලංගු නැත. එහෙත් බුද්ධ දර්ශනය යටතේ පැහැදුණ නගර ශෝභනියක් වූද බිම්බිසාරගේ පෙම්වතියක් වූ අම්බපාලිය ද රහත් තෙරණියක වී සසර කතරෙන් එතෙර වූවාය. මා ඇගේ කතාව නිම කළේ අම්බපාලිය සිහි කිරීමෙනි. පාඨක ඔබට, ජේසුස්වහන්සේගේ පහස ලැබී එතෙර වූ මරිය මග්දලේනා සේ අපි ද සුදුවර මධ්‍යස්ථකම පතමු.

# ක්‍රිස්තුස්වහන්සේ උදෙසා දිළින්දෙක් වූ පියතුමා



දිව්‍ය ගැලවුම්කරුවාණන් වන ජේසු සමිඳාණන්ගේ සුර ලොවට වැඩම කිරීමේ මංගල්‍යය වන එදින දී එනම්, 1932 මැයි මස 5 වන දින අප ලක් දේශයෙහි සුවිශේෂ උපතක් සිදුවිය. ඒ පූජක සිරි ඔස්කා අබයරත්න පියතුමා ය. ජීවිතයේ අනේකවිධ ප්‍රශ්න අභියෝග මෙන් ම පාපයේ අන්ධකාරයේ පතුලට වැටී සිටින ජනයා හට දේව පංගුකාරත්වයේ උරුමය මෙලොව දී ම අත්විඳින්නට දෙවි මහෝත්තමයාණන් වහන්සේ පෙර තෝරා ගත්තේ එතුමන්ව බව අවිවාදිත ය.

සිය ජීවිත කැඳවුම පූජාප්‍රසාදි තුමකු වීම බව අවබෝධ කරගත් එතුමා දෙව්සත්හල් පුහුණුව අවසන් කිරීමෙන් පසුව 1957 පෙබරවාරි මස 2 වන දින කොටහේන ශාන්ත ලුසියා ආසන දෙව්මැදුරෙහි දී අති උතුම් බෙන්ජමින් තෝමස් කුරේ අගරදගුරු හිමිපාණන්ගේ සුරතින් පූජක අභිෂේක ගැන් විණ. එතැන් පටන් එතුමා ශ්‍රේෂ්ඨයන් විසින් තමන්ට පවරා දුන් සේවා ඉටු කරමින් වැඩිහිටියන් මෙන්ම තරුණ තරුණියන් අතර ද විශේෂ මෙහෙවරක නිරත විය. එතුමාගේ ජීවිත ගමනේ දිශානතිය වෙනස් කළ විශේෂ සිදුවීමේ පසුබිම වනුයේ ද අගරදගුරු පදවිය තුළ තරුණ කටයුතු භාර උපාධ්‍ය පියතුමා ලෙස සේවය කිරීමේ දී එවකට ලක් දේශයේ සිදු වූ තරුණ කැරැල්ල යයි පැවසීම නිවැරදි ය. එතුමන් හා තරුණ ව්‍යාපාරයට සම්බන්ධව සිටි තරුණයන් එවකට පැවති කැරැල්ල හා සම්බන්ධ වීම නිසා එතුමා අත්විඳී වේදනාත්මක ජීවිත අරගලය අගරදගුරු හිමිපාණන් සමඟ විවෘතව බෙදාගැනීමට යෙදුණි. මෙහි ප්‍රතිඵලය ලෙස රෝමය හා පසුව එංගලන්තයේ සරේ ප්‍රාන්තයේ ජීවත් වූ බොබ් බෝල්කන් පවුල සමඟ ජීවත් වීමේ අවස්ථාව උදා විය. ඔවුන් සමඟ සහභාගී වූ යාච්ඤා රැස්වීම තුළ අත්දුටු ශුද්ධාත්ම ස්පර්ශයේ බලය කරණකොටගෙන ආසියාවේ පළමු ශුද්ධාත්ම ව්‍යාපාරයෙහි නියමුවාණන් වීමේ භාග්‍යයට හිමිකම් ලැබුණි.

එතුමා නැවත පැමිණීමෙන් පසු ගොඩනැගුණු ගිහි අපෝස්තලික ව්‍යාපාරය පසුකාලීනව කිතු දන පුබුදුව නමින් ශ්‍රී ලංකා දේශයේ මෙන් ම ලෝකයේ තවත් රටවල ව්‍යාප්ත වූයේ ශුද්ධාත්ම බව්තිස්මය (ස්නාපනය) අත්දුටු දහස් ගණන් ජනතාවගේ සාක්ෂි දැරීමේ ප්‍රතිඵලය ලෙසට ය. තමන් සමඟ එක්ව තම ජීවිතයේ ස්වාමිත්වය ජේසු සමිඳාණන්ට බාර දෙමින් උන්වහන්සේ ඉදිරිපත් කළ දේව රාජ්‍යයේ දැක්මට සාක්ෂි දරණ දස දහස් ගණන් ජනතාවක් බිහි විය. ඒ නිසාම සුවහසක් ජනතාව (කිතු දන පුබුදු ජනතාව) විසින් ම 'ස්වාමි තාත්තා' යැ'යි ආදරණීය ලෙස එතුමාණන්ට ආමන්ත්‍රණය කරන්නට වූහ. මන්දයත් එතුමන් සැබවින්ම ආධ්‍යාත්මික පියකු, තාත්තා කෙනකු වූ නිසා ය. එතුමන්ගේ ජීවිත දර්ශනය වූයේ ක්‍රිස්තුන් වහන්සේ ය. එය එතුමන්ගේ වදනින් පිට වූයේ මෙලෙස ය.

"ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය දෙස බැලුවොත් ඉපදුනේ කොතන ද? ජීවත් වුණේ

කොහේ ද? මැරුණේ කොතන ද? ඉතින් මේ ඔක්කොම බලනකොට මට පෞද්ගලිකව හැඟෙනවා උන්වහන්සේව අනුගමනය කරන එක ලෙහෙසි නැහැ කියලා. මේ වගේ තැනක (පොල් අතු සෙවිලි කළ කටු මැටි ගෙයක) ඉඳලා වත් උන්වහන්සේට කිට්ටු වෙන්නට බැහැ කියලා. අන්තිමේදී ක්‍රිස්තියානිය කියන්නේ නිකන් සත්‍යතා ගොඩක් ඉගෙන ගන්න එකවත් ඒ අනුව ජීවත් වෙන්න උත්සහ ගන්න එකවත් නෙවෙයි. ක්‍රිස්තුන් වහන්සේ නමැති තැනැන් වහන්සේට ලොකු සම්බන්ධකමකින් යුතුව උන්වහන්සේව තම ජීවිතයට බලපාන්නට ඉඩ දී ජීවත් වීමයි".

සැබැවින්ම තම ජීවිතය තුළ කිතු සමිඳුන් සමඟ ගැඹුරු සම්බන්ධකමට ඇතුළත් වී ක්‍රිස්තුන් වහන්සේව තම ජීවිතයට බලපාන්නට ඉඩ දෙමින් ජීවත් වූ එතුමා ඒ අත්දැකීම සුවහසක් කතෝලික ජනයා වෙත ළඟා කරලූයේ ශුද්ධාත්ම මගපෙන්වීම තුළ ය. එතුමාගේ දිවිය තුළ සැබෑ ක්‍රිස්තු ගුණාංග ඉස්මතු වූයේ නිර්ව්‍යාජව ය. එතුමාගේ දිවියේ ඇඳුම්, පැළඳුම්, භාවිත කළ නිවස, උපකරණ සියල්ල සරල ය; චාම් ය. අල්පේච්ඡ ජීවිතයක් ගත කිරීම තුළින් අත්‍යවශ්‍ය, අවශ්‍ය, අනවශ්‍ය දෑ පිළිබඳව අවදියෙන් කටයුතු කරන්නට ජනතාව හුරු කරවූයේ ක්‍රිස්තු ජීවිතය අනුගමනය කරමිනි.

"ක්‍රිස්තුන් වහන්සේ ජීවමානයි, උන්වහන්සේ හමුවන්න යැ'යි" ප්‍රකාශ කරමින් උත්ථාන වූ ස්වාමීන් වහන්සේ වෙත කිතුනුවන් යොමු කළේ ය. පෞද්ගලික යාච්ඤාව හෙවත් 'මගේ පැය' තුළ කිතු සමිඳුන් අත්දැකීමට මෙන්ම ස්වර්ගීය පියාණන් හමුවීමට ජනයා යොමු කළේ ය. සභා ජීවිතය, සක්‍රමේන්තු ජීවිතය, දේව වන්දනාව යන ක්ෂේත්‍ර තුළ පිබිදීමක් ඇති කළේ දෙවන වතිකාන සිහිනය පල ගන්වමිනි. ගිහියාගේ ධර්ම දූත කාර්යය මැනවින් අවබෝධ කරගත් එතුමා දේව රාජ්‍යය සඳහා පල දරන ගිහි ජනතාවක් බිහි කළේ ය. දිළින්දාගේ පැත්ත ගෙන ක්‍රියා කිරිමට අප පියතුමා නිතර උත්සුක විය. එයට පදනම වූයේ දිළිඳු, අසරණ ජනතාව තුළ මෙන්ම මහ මග දුක් විඳින සතුන් තුළ පවා (මැවිල්ල තුළ) "තනි වූ ක්‍රිස්තුන් වහන්සේ" හඳුනා ගනිමින් උන්වහන්සේව උත්ථාන කිරීමට ක්‍රියා කිරීම ය. සැම සක්‍රමේන්තුවකම හරය හා වටිනාකම ජීවිතයට ඒකාබද්ධ කළ එතුමා විශේෂයෙන් සරල සුදු මුදු විවාහය තුළින් දිළිඳුන් උසස් කිරීමට මෙන්ම විවාහ සක්‍රමේන්තුවේ වටිනාකම ඉහළ නැංවීම උදෙසා ක්‍රියා කිරීමට තරුණ තරුණියන්ට අභියෝග කළේය. බොරු විච්චූරණවලට, ආටෝපවලට හා උත්සවවලට නොව මංගල දිව්‍ය පූජෝත්සවය සඳහා මුල්තැන දීමට ඔවුන් ධෛර්යවත් කළේ විකල්ප දැක්මක් ඉදිරිපත් කරමිනි.

විශේෂකොට සඳහන් කළ යුතු යමක් ඇත. එනම් 1983 පමණ වන විට සිංහල කතෝලික බයිබලයක් නොතිබූ මෙන්ම සිංහල කතෝලිකයන්ට ඉතා ඈත්ව පැවති ශුද්ධ බයිබලය සිංහල කතෝලික දනගේ දෑතට දුන් දිවැසිවරයාණන් එතුමන් ය. එමගින් දේව වචනය කියවන්නට පමණක් නොව ඒ වචනය තුළ ජීවත් වන්නටත් වචනයාණන් වන කිතු සමිඳුන්ට සමීප වන අන්දමට මිනිස් හද ඇදී යන අන්දමින් පැහැදිලි කර දුන්නේ ශුද්ධාත්ම ආලේපය තුළිනි.

එතුමන් රට පිළිබඳ විශාල කැක්කුමකින් කතා කළේය. ක්‍රියා කළේය. අයුක්තිය, අසාධාරණය දුටු තැන එයට එරෙහිව පා නැගුවේ, (ඉරණවිල ඇමරිකන් හඬ, කණ්ඩලම හෝටලය,.....) දිවැසිවර කාර්යයට උර දෙමින් ය. එතුමන් දේශපාලනය ගැන කතා කළේ සැබෑ දේශප්‍රේමියකු ලෙස ක්‍රිස්තු ආකල්පය වන දේව රාජ්‍යයේ පදනමිනි. එහෙත් මෙරට ප්‍රධාන ධර්මය වන බෞද්ධ ධර්මය මත පදනම්ව රට ගොඩනැගිය යුතු බව නොබියව හා පළමුවරට කතා කළ සිංහල කතෝලික පූජකතුමන් එතුමන් ය.

කිතුදන පුබුදුව තුළ සුදු මුදු විවාහයන් තුළින් ආශීර්වාදකාර බන්ධන දේව ප්‍රසාද නිධානය ලැබූ අප, මගේ බිරිඳගේ පැලෝපියානු නාලයේ ඇතිවූ

21 වන පිටුවට.....

**ටී. ක්‍රිශාන් ප්‍රනාන්දු**
විජය කටුපොත

# ජීවිතය තිළිණ පුෂ්ප මංජරියකි

වසර අසූහයක ජීවිතය අත්විඳ ඇති මා, මගේ ජීවිතය මා ලද තිළිණයක්ද යන්න ආවර්ජනය කිරීමේදි, එහි පදනම කිතුනු ඇදහිල්ලේ බයිබලීය පදනම වේ.

යෙසායා 46:3-4 උපච්ඡේදය භාවිතාර්ථයෙන් මෙසේ දැක්විය හැක. **"මම නුඹව උපන්දා සිට උසුලාගෙන ආවෙමි, උපන්දා සිට මම නුඹව රැකබලා ගත්තෙමි. මම නුඹව මැව්වෙමි. මම නුඹව රැකබලා ගනිමි."** මේ දේව වචනයට මගේ ජීවිතය කොතරම් දුරට සාක්ෂි දරයිද?

ජීවිතය පුෂ්ප මංජරියකි. එහි පුෂ්ප, අප ලබා ඇති ජීවිත තිළිණයි. මගේ ජීවිත අත්දැකීම අනුව මගේ ජීවිත පැවැත්මට මා ලබා ඇති ප්‍රධාන තිළිණ මෙසේ දැක්විය හැක.

01. ජීවනයේ ජීවිත තිළිණය
02. ආදරයේ ජීවිත තිළිණය
03. සොබාදහමේ ජීවිත තිළිණය
04. මානව සහෝදරත්වයේ ජීවිත තිළිණය
05. ඇදහිල්ලේ ජීවිත තිළිණය

### 01. ජීවනයේ ජීවිත තිළිණය

"මම නුඹව මැව්වෙමි" (යෙසායා 46:4) මම අහඹුවක් නොවෙමි. දෙවිඳාණන් මා බිහිවන්නට පෙර මා දැක ඇත. ඒ දැකීම අනුව මා නිර්මාණය කිරීමට අවශ්‍ය වන මගේ අම්මවයි, තාත්තවයි තෝරාගෙන මට ජීවිතය දීම මා ලද ප්‍රථම ජීවිත තිළිණයයි. මෙලෙස ප්‍රවේණියෙන් ජානමය ද්‍රව්‍ය මගේ කායික ස්වභාවය සකසයි. මා මවන්නේ, එනම් මගේ ස්වකීයත්වය පවත්වාගෙන යන්නේ මේ කායික ස්වභාවයයි. දෙවිඳුන්ගෙන් දෙමාපියන් හරහා මා ලද මේ කායික ස්වභාවයේ තිළිණය රැක ගැනීම මගේ දෙමව්පියන්ටත්, මැවුම්කාර මගේ දෙවිඳාණන්ටත් මගේ දිව්‍යමය වගකීමකි. මගේ ආයු ඔබේ පොතෙහි සටහන් කර තිබුණි (ගීතාවලිය 13:9-16). දෙවිඳුන් දී ඇති ආයුව ප්‍රශස්ත ලෙස ගෙවා අවසන් කිරීම, මා දෙවිඳුන්ට දෙන තිළිණයක්වේ.

### 02. ආදරයේ ජීවිත තිළිණය

"දෙවියන්වහන්සේ ප්‍රේමයයි" (1 ජොහාන් 4:8) කිතුනු ඇදහිල්ලේ පිහිටන මා අදහන්නේ මා දෙවියන්වහන්සේගේ ප්‍රේමයේ ප්‍රකාශයක් ලෙසය. ප්‍රේමය අත්විඳීමකි. ළදරුවියේදීම අම්මාගේ ආදරණීය සෙනෙහස අත්වින්ද මම ආදරයේ පළමු අත්දැකීම භුක්ති වින්දෙමි. අම්මා මට ආදරය කළාය. මම අම්මාට ආදරය කළෙමි. "කිසිවකු කිසි කලක දෙවියන්වහන්සේ දුටුවේ නැත. එහෙත් අප එකිනෙකාට ප්‍රේම කරමු නම් දෙවියන්වහන්සේ අප තුළ පරිපූර්ණ වන්නේය" (1ජොහාන් 4:12). අම්මාගෙන් ලද ආදරයෙන් මම දෙවියන්වහන්සේගේ ප්‍රේමය අත්වින්දෙමි. එයින් මගේ පරිපූර්ණත්වයට මඟ පෑදුනේය.

මෙලෙස මගේ බිරිඳගෙන් ලද ආදරය, දේව දීමනාවක් ලෙස මගේ විවාහ ජීවිතය සාරවත් කළේය. අප දෙදෙනාගේ ප්‍රේමයේ ජීවිතය මත දූ පුතුන් සමඟ දෙවියන්වහන්සේගේ ප්‍රේමය අත්විඳින ආදරණීය පවුලක් ගොඩනගා ගන්නෙමු. හිසකෙස් පැසෙන මහලුවිය ගත කරන මම මුනුපුරු මිනිපිරියන්ගේ සෙනෙහස මැද ආදරණීය ජීවිතයක් ගත කරමින් සිටිමි. පවුල තුළ අත්විඳින දේව ප්‍රේමය සැබවින්ම ප්‍රේමයේ ජීවිත තිළිණයයි.

### 03. සොබාදහමේ ජීවිත තිළිණය

"යෙසායා 45:18 උපච්ඡේදයේ අනුව දෙවියන් වහන්සේ පොළොව සාදා නිම කළ ඇත්තේ පාළු ඉඩමක් ලෙස නොව, විසුමට තැනක් ලෙසය." විශ්වය නිර්මාණාත්මකව සැලසුම් කර සමස්තයක් ලෙස සකසා ඇත්තේ ජීවිතය සහ මානව වර්ගයා තම මූලික පරමාර්ථය සහ තම පැවැත්මට හේතු කාරණය ලෙසත් යථාර්ථයේ සියලු අංශවල අර්ථය සහ තේරුම් ගැනීම මේ මූලික කරුණ තුළ ඇති බවත් ඉදිරිපත් කරන හරවත් අදහස, ලැබී ඇති ජීව විද්‍යාත්මක විද්‍යාවල ඇති සාක්ෂිවලින් සනාථ වන බව නවසීලන්තයේ ඔටාගා සරසවියේ මානව අණුක ජන විද්‍යා පර්යේෂක ආචාර්ය මයිකල් ඩෙන්ටන් නිගමනය කර ඇත. මේ අනුව මිනිසුන් ලෙස අප ලබන ජීවිත තිළිණයකි සොබාදහම.

### 04. මානව සහෝදරත්වයේ ජීවිත තිළිණය.

"සහෝදරයන් මෙන් එක්ව විසීම කොතරම් යහපත්ද?" (ගීතාවලිය 133 :1)

සැබෑ සහෝදරත්වය වනුයේ එක්ව ජීවිතය අත්විඳීමය, අවංක බෙදා ගැනීම, පරිත්‍යාග ශීලි කැපවීම, සානුකම්පිත සහනය, නිර්මාණශීලි දායකත්වය, මිනිස් අභිමානයට ගරු කිරීම වැනි ගුණාංගවලින් සැබෑ මානව සහෝදරත්වය සාරවත්ව වැඩේ. අපේ ඒකාග්‍ර පූර්ණ ජීවිතයට දායක වන අධ්‍යාපනික මැදිහත්වීම්, සෞඛ්‍ය පහසුකම්, වෘත්තීය කුසලතා, රසවින්දන සාහිත්‍ය කලා නිර්මාණ, ආහාර නිෂ්පාදන වැනි පොදු යහපත සඳහා නිමවෙන නිමැවුම් සැබවින්ම මානව සහෝදරත්වයේ ප්‍රකාශනයි. මිනිසුන් ලෙස අපේ දිවි පැවැත්මේ අනාගතය තීරණය කරනු ලබන්නේ මේ මානව සහෝදරත්වයේ ජීවිත තිළිණය හරහාය.

### 05. කිතුනු ඇදහිල්ලේ ජීවිත තිළිණය

"අප කෙරෙහි උන්වහන්සේගේ ප්‍රේමය ප්‍රකාශ කරන සේක් දෙවියන්වහන්සේ ස්වකීය ඒක ජාතක පුත්‍රයාණන්, අප උන්වහන්සේ කරණකොටගෙන ජීවත්වන පිණිස ලෝකයට එවා වදාළ සේක" (1ජොහාන් 3:9). අපේ ජීවිතය දේව වචනයට කීකරුව අර්ථවත් ජීවිතයක් කර ගැනීමට අපට දෙවියන් වහන්සේ ප්‍රදානය කර ඇති ජීවිත තිළිණය ජේසුස්වහන්සේය. ජේසුස්වහන්සේ අනුව යැමෙන් අපේ ජීවිත දෙවියන්වහන්සේටත්, උන්වහන්සේගේ ජනතාවටත් ප්‍රසන්න ජීවිත වන බව නිසැකය. ජේසුස්වහන්සේව අදහන අපේ ඇදහිල්ල ඔබත් මාත් ලබා ඇති ප්‍රශස්තම ජීවිත තිළිණයයි. අපේ කිතුනු ඇදහිල්ලේ පිහිටා පරිපූර්ණ ක්‍රිස්තියානි ජීවිතයක් ගත කළේය යන ස්වර්ගීය හැඟීමෙන් අපේ අවසන් හුස්ම හෙළන්නේ නම් අප කොතරම් භාග්‍යවන්ත වන්නේද?දෙව්දූන් දුන් ජීවිත තිළිණ පුෂ්ප මංජරිය දෙව්දූන්ටම තිළිණ කරමු.

**වි. ලෙ. පීරිස්**

කලාපයෙන් කලාපයට භක්තියෙන් ප්‍රබෝධනයට ලියන

## චුට්ටා

### චූටිකමට කියන කතා....

ජීවිතය මාරයි. මාරයා අත ළඟයි. මේ මාර ජීවිතයට මාර තර්ජන. ගහකොළ සතා සිවුපාවුන්ටත් ජීවිතයක් තියනවා. ඒ ජීවිතය රැකගන්ට උන්ට තියුණු දත්, දළ, හොට, අං, කටු දීලා තියෙනවා දෙවියො. ඒ ඉතින් මනුෂ්‍යන්ගෙන් පරිස්සම් වන්න කියලයි. මේ කාගේ ජීවිතයටත් ආහාර අත්‍යවශ්‍යයි. ඒත් ඉතින් සතුන් තමන්ගේ කෑම ටික කොහොමහරි හොයාගන්නවනෙ. කිලෝමීටර දහස්ගණන් ඇවිදිනවා, පියාඹනවා.

අපේ ගෙවත්තේ ගස්වල ගෙඩි හට ගන්නේ අපිට විතරක් නෙවෙයි. ඒ ගෙඩිවලින් හතරෙන් එකක් අයිති සතුන්ටයි. අඹ ගහක පලතුරු ගස්වල ගෙඩි හැදුණම ඇයි අපි ඇට්ටි බැට්ටි පවා හූරන් කන්නේ? එහෙම කනකොට ගිරවු මයිනො අඹ කොට්ටෝරුවෝ අහිංසක කුරුලු පැටවු මනුෂ්‍යන්ටත් ශාප කරනවා ඇති. "මුං වගේ කාලකණ්ණි ටිකක්, මළ පෙරේතයෝ වගේ සේරම හූරන් කාල" යැයි සතුන් කියනවා ඇති. ඒ නිසා මගේ ජීවිතේ විතරයි ද මට වටින්නේ? අනික් උන්ට හෙණ ගැහුවත් කමක් නැද්ද? ජීවිතේ දෙන්නේ දෙවියන්, ඒ ජීවිතය අයිතිය ඇත්තෙත් දෙවියන්ටමයි. ඒ හින්ද තමන්ගෙ ජීවිතේ හෝ අන් අයගේ ජීවිත උදුරා ගන්න කාටත් අයිතියක් නෑ. බල්ලො මරලා මළ කුණත් විකුණන් කන (අ)මනුෂ්‍යයො ඉන්න රටක් ද මේක. අනේ මන්ද........?

**ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ. තු. නි. පියතුමා**

## මතවාද සහ මතභේද

තර්ක බුද්ධියෙන්
විවාද සම්පන්න වීමෙන් නොව
මතභේද නිරාකරණය විය හැක්කේ
අන්‍යෝන්‍ය අවබෝධය පුළුල් වීමෙනි.
ප්‍රතිවාද කුඩුපට්ටම් කර දැමීමට
ප්‍රහාරාත්මක තර්කණයට හැකි වුවද
වැරදි මතයක රැඳී සිටින්නකුව
ඉන් මුදවාලීමට එමගින් බැරි ය.

සොඳුරු මානවයන්ගේ අරමුණු,
චේතනා සහ ප්‍රාර්ථනා
බොහෝවිට සමීප වුව
එම උතුම් පැතුම්
ඉටු කරගත හැක්කේ කෙසේද යන
අනුමාන ඒකීය නැත.

අනුමාන හැමෝගෙම
ඒකීය නොවීම
ස්වාභාවික බැවින් එහි වරදක් ද නැත.
අනර්ථකාරී වනුයේ
තමාගේ අනුමානය
හුදෙක් අනුමානයක් පමණක් බව
නොපෙනීම ය.

අනුමානය යනු ප්‍රත්‍යක්ෂය නොවේ.
එමෙන් ම
ඔබේ ප්‍රත්‍යක්ෂය අනුන්ටත්
අනුන්ගේ ප්‍රත්‍යක්ෂය ඔබටත්
බොරුවක් විය හැකිය.
අනර්ථකාරී වනුයේ
යමක එක පැත්තක් පමණක් දැක
ඒ අර්ධ සත්‍යය
පූර්ණ සත්‍යය යයි අවධානග්‍රාහී වීම ය.
මතවාදමය ඒකඟතා මත
අමිත්‍ර වීම අනුවණකමකි.
මන්ද,
පුද්ගලයන් පරිණත වීමේදී මෙන්ම
පටු වාසිය පිණිසත්
පහසුවෙන් මතවාද වෙනස් වන බැවිනි.

සැබෑ මිත්‍රකමේ පදනම වනුයේ
තමන්ව හෙළි කිරීමේ විවෘතකමත්
අනිකාව තේරුම් ගැනීමේ වුවමනාවත්
අන්‍යෝන්‍ය නිදහස කෙරෙහි වූ
ගෞරවයත් ය.

තමන් තුළ වෙසෙන යක්ෂයාව
නොහඳුනන්නන් අතර
පංගුපේරු සහයෝග මිස
සැබෑ මිත්‍රකම් නොපවතී.

සත්‍යයම යයි
තමන්ට කාවැදී ඇති මතවාද
අනුන්ට ඒත්තු ගැන්වීම පිණිස
මතවාදයකින් මත්වූවෝ කැපවෙති.
ආකර්ෂණීය කරනු පිණිස
තම මතවාදයට
අතිශයෝක්තිය සහ අසත්‍යය ද
මිශ්‍ර කිරීමට ඔවුහු කැමති වෙති.

අප වැයම් කළ යුත්තේ
මතවාද ව්‍යාප්ත කිරීමට හෝ
ප්‍රතිවාද මැඩලීමට හෝ නොව
අප අතර ඇති

එකඟතා සහ නොඑකඟතා
මොනවාදැයි
සුහදව පැහැදිලි කර ගැනීමටය.

යහපත් ලෝකයක් අවංකවම පතන්නන්
මතභේද මත එදිරිවාදී වී සිටීම
තමන්ට ද ලෝකයට ද අහිතකර ය.
එය හිතකර වනුයේ
වංචා සහගත තක්කඩියන් රජ වීමටය.
ලෝකය සුවපත් වීමට හිතකර වනුයේ
චින්තනයේ අවදි බව මිස
මතවාදවල සන්නද්ධ වීම නොවේ.

ආකර්ෂණීය මතවාද ව්‍යාප්ත කර
ප්‍රජාතන්ත්‍රීයව බලයට ආ හිට්ලර්
ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කර
ලෝකය අපායක් කළේය.
චේතනා අවංක වූ පමණින්
ක්‍රියාමාර්ග නිවැරදි නොවේ.
මා සහ ඔබ ඇතුළු
සියල්ලන්ම සම්බන්ධයෙන් මෙය වලංගුය.

තමන් නිවැරදිය යන මානය
විනාශකාරීය.
තමන් නිවැරදි ද යන සෝදිසිය
ගැලවුම්දායකය.
අප දායක විය යුත්තේ
මතවාද වැපිරීමට නොව
තමන්ගේද අනුන්ගේද
චින්තනය අවදිවීමට ය.
අවදි වූ සිත
කාලයේ ද දේශයේ ද සීමා ඉක්මවයි.

සපුගස්කන්දේ රංජිත්

**ක්‍රිස්තුස්වහන්සේ... 17 වන පිටුවෙන්.....**

ගැටලුවක් නිසා දරුවන් දෙදෙනෙක්ම ගබ්සා වූහ. ඒ නිසා අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර ලැබුවත් එය නිවැරදි තත්ත්වයකට ගෙනෙන්නට හැකියාවක් නැති බව වෛද්‍ය මතය විය. අවම වශයෙන් වසර පහක් යනතුරු දරුවන් ලැබීමේ බලාපොරොත්තුව අතහරින ලෙස වෛද්‍යවරු අපට පැවසූහ. එය එසේ වුවත් දෙවියන්වහන්සේට සියල්ල කළ හැකිය යන්න අපි තරයේ විශ්වාස කෙළෙමු. අපගේ ජීවිත විප්ලවීය ආකාරයෙන් දේව වචනය හරහා වෙනස් කළ ගරු ඔස්කා පියතුමන්ට අපව ආශීර්වාද කරන ලෙස ඉල්ලූ අතර එය විශ්වාසයෙන් අයිතිකර ගතිමු. පුදුමයකි වෛද්‍ය මතය වෙනස් වී වසරක් ඉකුත් වන්නත් කලින් මගේ බිරිඳට දරුවකු කුසට ඇවිදින් දරුවා ඉතා හොඳින් වැඩී මෙලොවට උපන්නේ ප්‍රාතිහාර්යාත්මකවය. එය ලොකු කථාවක් වුවත් අපේ අද්දැකීම නම් ස්වාමි තාත්තා මෙලොව සිටියදීම දෙවියන්වහන්සේ සමඟ තිබුණාවූ ගැඹුරු සම්බන්ධතාව නිසාම එතුමාගේ මධ්‍යස්ථකම තුළ මේ දරුවා උපන් බවය. ගරු ඔස්කා පියතුමා ඒ අවස්ථාවේදී රෝගීව ඇඳේ වැඩිපුර කාලයක් ගත කළත් එවකට ජීවතුන් අතර වූ සුදුවර චරිතයක් බව අපි දෙදෙන විශ්වාස කරමු. දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා.

එබැවින් එතුමන් අතින් ශුද්ධවූ සභා මාතාවටත් සිරි ලක් දේශයටත් සිදු වූ සේවය මෙතෙකැයි කියා නිම කළ නොහැකිය. අද ශාරීරිකව එතුමන් අප අතර නොසිටිය ද එතුමන් ඉදිරිපත් කළ දැක්ම, දර්ශනය ජනතා හදවත් තුළ ජීවමාන ය. එතුමන් තුළ පැවැති ආශාව වූයේ කොහේවත් මග නොරැඳී දෙව් පිය තුරුල්ලට නික්ම යාම ය. එතුමන්ගේ එම ආශාව පසුගිය වසරේ නොවැම්බර් මස 04 වන දින ඉටු වූ බව අපගේ විශ්වාසය යි.

# ජීවත් කළ යුතු තිළිණය

දෙවිඳුන් මැවූ අපේ ශරීරය මෙලොව තිබෙන පුදුමාකාරම මැවිල්ලයි. දෙවිඳුන්ගේ බලමහිමය ඒ තුළින් විදහා පායි. එහෙත් සමහරුන් කිසිම කෘතවේදීතාවක් මවා වදාළ දෙවිඳුන්ට දක්වන්නේ නැත. ශරීරයේ ක්‍රියාකාරීත්වය පුදුමාකාරයි. අපේ හදවත ඉබේ ක්‍රියා කරයි. ආහාර ගත්විට ශරීරයට අවශ්‍ය පෝෂණය ලැබේ. ආශ්වාස, ප්‍රශ්වාස කිරීම නිරන්තරයෙන් හදවත ක්‍රියා කිරීමෙන් ඉබේම සිදු වේ. අප නින්දට ගියත්, නොගියත් ඉබේ ක්‍රියාකාරී වේ. දැකීමට ඇස් ද, ඇසීමට කන් ද, කථා කිරීමට හා ආහාර ගැනීමට මුඛය ද ඇත. දෙවියන්වහන්සේ හා සමානව මැවූ එකම මැවිල්ල මනුෂ්‍යයායි. "ඔබ දෙවියන්වහන්සේගේ මන්දිරය බවත්, ඔබ තුළ දෙවියන්වහන්සේගේ ආත්මයාණන් වැඩ වසන බවත් නොදන්නාහුද? කිසිවෙක් දේව මන්දිරය වැනසුවොත් දෙවියන්වහන්සේ ඒ තැනැත්තා වනසන සේක. දෙවියන් වහන්සේගේ මන්දිරය විශුද්ධය. ඒ මන්දිරය නම් ඔබය" (1 කොරි. 3:16-17).

සියලු මැවිලි අතරින් හොඳ, නරක, තේරුම් ගැනීමට පුළුවන් මිනිසාට පමණි. මොළයට එන අදහස් තුළින් එන සිතුවිලි හොඳට හෝ නරකට ක්‍රියා කිරීමට අපට 'නිදහස් කැමැත්ත' දෙවිඳුන් දී තිබේ. නිදහස් කැමැත්තට දෙවිඳුන් කිසි දිනක ඇඟිලි නොගසා කැමති හෝ අකමැති දේ කිරීමට නිදහස දී තිබේ. අපට ශරීරයක් පමණක් නොව ආත්මයක්ද ඇත. දෙවිඳුන්ට වන්දනා කිරීම, තුති පිදීම අපේ පරම යුතුකමකි. උන්වහන්සේට ප්‍රේම කිරීමෙන්, වැඳීමෙන් අපේ කෘතඥතාව නිතිපතා, හැම මොහොතකම කළ යුතුය. සොබාදහම තුළ අපට ලබා දී තිබෙන ලස්සණ පරිසරයද රැකගත යුතුය. ජීවන හුස්ම ලබාදෙන ගහකොළවලට, පරිසරයට, සතාසිව්පාවාටද ආදරය කළ යුතුය.

පරිසරයට සතාසිව්පාවාට ආදරය කළ අසීසියේ ශු. ප්‍රැන්සිස් තුමා, දිනක් සහෝදර තාපසයකු සමග දේශනා කිරීමට ගමේ නගරයට පැමිණියා. ශු. ප්‍රැන්සිස් තුමා නගරයට පැමිණිවිට කළේ, අසරණව ඇවිදගැනීමට බැරි මහලු මවකට පාරෙන් අනික් පැත්තට යෑමට උදව් කිරීම, ගැමියන් සමග පිළිසඳරේ යෙදීම, ඇවිද යන බල්ලන්ව හුරතල් කිරීමයි. අවසානයේදී දෙදෙනාම නැවත ආරාමයට යෑමට පිටත් වුණා. එතුමා සමග පැමිණි තාපස සොහොයුරා "අපි ආවේ දේශනා කිරීමට නේද" කියා, ශු. ප්‍රන්සිස් තුමාගෙන් ප්‍රශ්න කළා. එතුමා දුන් පිළිතුර නම් "අපි දේශනා කර අවසානයි. අපි මිනිසුන්ට ආදරය කළා, සතුන්ට ආදරය කළා, ඒ තමා දේශනාව". එතුමා සියලු සතුන්ට, කුරුල්ලන්ට දෙවිඳුන් අපට වගේම ආදරය කරන බව සිහිපත් කළා. කෙනකුගේ ආගම කුමක් වුවත් වැදගත් වන්නේ, ගත කරන්නේ යහපත් ජීවිතයක්ද, අයහපත් ජීවිතයක්ද යන්නය. කෙනකුට උපකාර කිරීමෙන් ලබන ප්‍රීතිය වචනයෙන් විස්තර කළ නොහැකිය. තමන්ට පමණක් යම් සේවයක් කර ගැනීමෙන් ඒ ප්‍රීතිය නොලැබේ. සැම දෙනාම එකම මනුෂ්‍ය පවුලට අයිති බව සිතනව නම් සාමය, සතුට ලොව තුළ පවතී.

අප සැමට දෙවිඳුන් දී තිබෙන ජීවිතය තිළිණයකි. ශරීරික ශක්තිය, ආත්ම ශක්තිය සහ බලය යෙදීමෙන් සැම ප්‍රශ්නයකදීම විසඳුමක් සොයා ගැනීමට පුළුවන. ගැඹුරට සිතීම, සාකච්ඡා කිරීම, යාච්ඤා කිරීම අත්‍යවශ්‍ය කරුණුයි. දෙවිඳුන් කෙරෙහි විශ්වාසය තබා කටයුතු කිරීමෙන් සාර්ථක ප්‍රතිඵල ලැබේ. තමන්ට එන දුක් කරදර දෙවිඳුන්ට බාර දීමෙන් සැහැල්ලු ජීවිතයක් ගතකරනවා වෙනුවට, සමහරු තමන්ට විසඳුමක් සොයා ගැනීමට හැකි බව සිතා මානසිකව හා කායිකව රෝගී බවට පත් වේ. අබ ඇටයක් තරම් විශ්වාසයක් දෙවිඳුන් කෙරෙහි තිබේ නම් විසඳුම් සොයාගැනීම අපහසු නැත. බලාපොරොත්තු තබා කටයුතු කිරීමෙන් සැම දෙයකදීම විසඳුම සොයාගැනීමට හැකිය. කිසි දිනක ප්‍රශ්නයට බියෙන් මග හැර යෑමට නොසිතන්න. එන ඕනෑම අභියෝගයකට නොබියව මුහුණ දී විසඳුම් සොයා ගැනීමට හැකියාව තිබේ. එයින් ලබන ජයග්‍රහණය කෙතරම් ප්‍රීතිදායක ද. මෙලොව සිටින ප්‍රීතිමත් ජීවිත ගත කරන අය ඒ සතුට ලබා ගෙන තිබෙන්නේ, ආධ්‍යාත්මිකව තම ජීවිතය ගත කිරීමෙන් හා ප්‍රශ්න, අර්බුද, මැඩගෙන ජීවිතයේ ජයග්‍රහණය ලැබීමෙන් ය. ඒ ලබන සතුට වචනයෙන් කියා නිම කළ නොහැකිය. මෙවැනි අය නිතරම සිනා මුහුණෙන් ජීවත් වෙති.

ශු. අගුස්තීනු මුනිතුමා පාප අන්ධකාරයේ ගත කළ ජීවිතය හැරදා, දෙවිඳුන් වෙතට හැරීමට හේතු වූයේ, එතුමාගේ මව වන ශු. මොනිකා මුනිතුමියගේ බලගතු යාච්ඤාවයි. සිත් හැරීමක් සැණකින් සිදු වීමට පුළුවන. පාපී ජීවිතය බැහැර කිරීමට ශු. අගුස්තීනු මුනිතුමාට ශක්තිය ලැබුණේ තම මවගේ යාච්ඤා බලයෙනි. ජීවිතය නම් 'තිළිණයකි'. එය දෙවිඳුන්ගෙන් ලැබූ ලෙසම, නැවත දෙවිඳුන්ට තිළිණයක් ලෙස පුද කිරීමට හෝ නොකිරීමට තීරණය කිරීමට ඇත්තේ අපටයි.

**බී. කුරුකුලසූරිය**

# ඕං එහෙනං



පුණ්‍ය භූමියයි දහම් දිවයිනයි මුතු ඇටයට වුණ දේ — සොබනා
යෝධ යෝධ බල මිනිසුන් සිටි රට අතීතයේ පාඩම් — සොබනා
අහස උසට දාගැබ් සැදුණෙ උන්ගෙ ශක්තියේ බල — සොබනා
එහෙව් රටේ අද අඩුබර දරුවෝ කප් ගහනා හැටි බල — සොබනා

වසංගතෙන් පසු සාගතෙ එන බව ඇමතියො පුරසාරම් — දොඩනා
සාගතයේ මුල අමන මෝඩ තකතීරු තීරණ යයි කදිමෙට — පෙනෙනා
පෙරදිග ධාන්‍යාගරයයි පැවසූ රටේ ගොවියෝ මහපාරට — බහිනා
මඩ සෝදාගත් කළ රජකම වෙනුවට නැනෝ අසූචියට නැව් — නග්ගන්නා

පේලි සැදී වර සිමෙන්ති මෙහෙ නෑ මැට්ටෙන් ගේ දොර — සදාපියව්
කිරි පිටි මෙහෙ නෑ ළමයි අඬනකොට තන කිරි පොවලා — නළවපියව්
ගෑසුත් මෙහෙ නෑ දර ලිපෙ උයලා අතීතයට දුව — අඬාපියව්
ඉන්ධන මෙහෙ නෑ දියවන්නාවේ ගොන්රැල බැඳලා ජක්මක් කියලා — දක්කපියව්

කොරෝනාවි දැන් ඔමික්‍රෝන් බැඳගෙන ලෝකය උඩු යටිකුරු කරනු — පෙනේ
අවදානම ඒ ලෙසමයි අපටත් ජන ජීවිතය සුපුරුදු පරිදි කරනු — පෙනේ
සුව නීතිය ලෙස මුකවාඩම් නම් කාටත් බෙල්ලට දමනු — පෙනේ
තිබුණත් නොතිබුණ ගානට මිනිසුන් රටතුළ සැරිසරනවා — පෙනේ

ජීවන ගමනේ බාධක එමටයි දුකසැප ජය පැරදුම — නියතයි
අනාගතය කෙලෙසින් කෙලෙසටදෝ නිමිත්ත පෙර පැවසීම — සැකයි
ගෙවත්තෙ පැළයක් සිටුවා ගන්නට ඇමතියො පිළිවදන් — දෙසයි
රට වැසි ජනතා කෝපය පුපුරා රැල්ලක් පැන නගිනව — සිකුරුයි

දෙවිඳුන්ගෙන් ලද ජීවිත තිළිණය ජීවත් කරවන්නේ — කෙලෙසයි
සිත සිත කුමකට කරදර වෙම්දෝ වටපිට බැලුවිට එය — විසඳෙයි
අහසේ පියාඹන කුරුලන් බලන්න අටුකොටු උන් රැස්කර — නොමැතියි
එය එලෙසයි නම් බියවනු කුමකට දෙවිඳුන් ඇතිතැන ජය — සිකුරුයි

සූරිය මාමා - ජෝසප් ඩයස්

# පුංචි විකුම් ළමා ප්‍රබෝධනය



මේ දිනවල මුහුද වලාල නිසා මාළු ඇල්ලීම පිණිස ධීවර යාත්‍රාවල නැගී මුහුදු යනු දක්නට ලැබේ. ඒ අතර මාදැල් වට කිරීමෙන් මාළු ඇල්ලීමද මේ දින වල ජයටම කෙරේ. ඒ දවස් වලට අලුත් මාළු ටිකක් ගන්න හිතාගෙන වැල්ලට යාම ද මගේ සිරිතකි. රෑ මුහුදු ගිය ධීවර යාත්‍රා තරඟෙට මෙන් ගොඩ බිමට ඇදෙනු දක්නට ලැබේ. ඒ අතර මාදැල ද ගොඩවීමට ඇත්තේ සුළු මොහොතකි.

ධීවර යාත්‍රා පැමිණි පසු දැල්වලින් මාළු බේරීම සිදු කරන අතර දැල් ගසන විට මාළු ඈතට විසි වේ. මාදැලේද එසේමය. පුංචි පුංචි මාළු සමහරවිට වෙරළට විසි කරනුද දක්නට ලැබේ. මෙය ලස්සණ දසුනකි. සමහර විට ගාලු පාරේ ගමන් ගන්නා බොහෝ පිරිස් දැල ගොඩ වෙනවා බලන්නට එක්රොක් වෙති. ඔවුන්ගේ මුහුණුවල සතුටත් ත්‍රාසයත් ගැබ්වී ඇතැයි මට සිතේ.

මට කියන්නට ඕන උනේ මාළු ඇල්ලීම හෝ වැල්ලේ සිරියාව ගැන නොවේ. දුක් බර දසුනක් ගැනයි. පුංචි කොලු පැටවු දෙන්නෙක් අර මිනිසුන්ට අත පා යමක් ඉල්ලනු දක්නට ලැබුණු අතර, සමහරුන් කීයක් හරි දුන්නත්, තවත් සමහරුන් ඒ දරුවන් එළවා ගන්නවා මම දුටුවෙමි. එසේ මාදැල අසලට ළඟාවන ඒ දරු පැටවු දෙන්නා දැල් ගසන විට මාළු පැටවු එකතු කර සිරිසිලියකට දා ගන්නා අයුරු මම දුටුවෙමි.

අවුරුදු අටත් - දහයත් අතර වන මේ දරු පැටව් දෙන්නා අයියයි මල්ලියි බව මම දැන ගතිමි. සෙමෙන් සෙමෙන් ඔවුන් වෙත ගිය මට අසන්නට ලැබුනේ තමන් අයියයි - මල්ලීයි වන අතර, තාත්තා මියගොස් ඇති බවයි. අම්මා එදා වේල සරි කර ගැනීමට ගෙදරක කුලී වැඩ කරනු ලබන අතර, එදින නංගිට බෙහෙත් ගන්නට ඉස්පිරිතාලෙට ගිය බව ඔවුන්ගෙන් දැන ගතිමි.

ගොඩක් දිනවල හරිහමං ආහාරය ඔවුන් නොලබන අතර වැඩිපුරම සම්බෝලයි බතුයි කන බව ඔවුන් කීවේ ඉතා දුක්බර විලාසයෙනි. සිරිසිලියට එකතුකර ගත් මාළු ටික ගෙදර ගෙන ගොස් උයා - පිහා අම්මයි නංගියි එනතෙක් ගෙදරට වී නොකා සිටින බව ඔවුන්ගෙන් දැන ගතිමි. ඔවුන් දෙදෙනා පාසල් යන බවත් ඔවුන් කියා සිටියේ ඉමහත් සතුටිනි.


ආදර පුංචි - පුතේ මේ පුංචි කතන්දරයෙන් අපිට ගොඩක් පාඩම් කියා දෙන බව අපි සිතට ගනිමු. සමහර විට කෑමට පුංචි අඩුවක් තිබුණොත් අපි අම්මාට මොනතරම් දොස් කියපු වාර ඇත්ද? තුන් වේල හරියට නොලැබුණොත් නොකා සිටීමට තරම් අපි දරදඬු වූ අවස්ථා කොපමණ ඇත් ද?

අද අපේ රටේ මෙවැනි දරුවන් මෙතරම් ඇත්ද? සමීක්ෂණයකින් ආසියාවේ අඩුබර දරුවන් සිටින රටවල් අතුරින් දෙවැනි තැන අපට හිමිවී ඇති බව ඔබ දන්නවාද? පුංචි පුතේ ඒ ගැන හොඳට හිතන්න. ඔබ වැනිම මෙවැනි දරුවන්ට හැකි පමණින් උදව් උපකාර කරන්න පුරුදු වෙන්න. සමහර විට අපි මොනතරම් රස කැවිලි කනවා ඇද්ද?

අපට දකින්නට - අසන්නට ලැබෙන හැටියට කොස් ටිකක් තම්බා ගෙන තුන්වේලම සරි කරන පවුල් සිටින බව ජනමාධ්‍ය ඇසුරින් අපි දකින්නෙමු. එනිසා හොඳට හිතන්න. අන් අයගේ වේදනාව ගැන, කුස ගින්න ගැන සංවේදී වන්න.

**සූරිය මාමා**

## ප්‍රහේලිකා අංක - 65



### හරහට

1. රොඩී කුලයට කියන නමකි.
6. දෙවියන්වහන්සේ "අපගේ ස්වරූපය අනුව අපගේ ............................ ලෙස මනුෂ්‍යයා මවමු" යි වදාල සේක.
7. තරුණ කාලය මනුෂ්‍ය ජීවිතයේ ............................ කාලය ලෙස හැඳින්වේ.
9. ජීවිතය හා සමානව වැදගත් දෙයකි.
11. ගෘහස්ථ ක්‍රීඩාවකි.
12. ත්‍රිවිධ රත්නයේ පිහිට.
14. අප දෙවිඳුන්ගෙන් ලද තිළිණයකි.
16. මනුෂ්‍ය ජීවිතයට විරුද්ධ ප්‍රබලම පාපයකි.
18. මනුෂ්‍ය ජීවිතයේ විවිධ කාල වකවානු තීරණය කෙරෙන මූලික සාධකය.
20. ඉතා කුඩා පක්ෂියෙකි.
21. නොමැරෙනසුලු'

### පහලට

1. "සක්විති" යන්නට තවත් නමකි.
2. "පරිණාමවාදය" ඉදිරිපත් කළේ
3. තල තුනක නිර්මිත
4. වත්තේ වැඩට උදව්වන ආයුධයකි.
5. එදිනෙදා ජීවිතයේ ආදායම් සමග ගලපා ගත යුතු දෙයකි.
8. ජීවිතයේ ජවසම්පන්නම අවධිය.
10. පුද්ගලයකුට ජීවිතය හා සමාන වටිනා දෙයකි.
13. ජීවිතය පවත්වාගෙන යාමට මෙය අවශ්‍ය වේ.
15. ජීවිතයේ එක්තරා සංසිද්ධියකි.
16. "ගලන .................... ජීවිතේ"
17. පළාත් නවයෙන් එකකි.
19. ශරීරය පිළිබඳ මිනුමකි.

ඔබගේ පිළිතුර තැපැල්පතක පමණක් ලියා පහත ලිපිනයට, **2022 පෙබරවාරි 28** ට පෙර තැපැල් කරන්න.

ජයග්‍රාහකයන් අතුරින් තෝරා ගත් **තිදෙනකුට මුදලින් තෑගි පිළිවෙලින්, රු.1000.00, රු. 750.00, රු. 500.00** බැගින් පිරිනැමේ.

**විශේෂ මතක් කිරීමක්** - ප්‍රහේලිකාවේ විසඳුම් එවන විට ඔබේ නම, පන්තිය, පාසල, පාසලේ සහ නිවසේ ලිපිනය සඳහන් කර එවන්න.

**ප්‍රහේලිකා අංක - 65**
**"ළමා භක්ති ප්‍රබෝධනය",**
**අංක 265,**
**ඩීන්ස් පාර, මරදාන,**
**කොළඹ 10.**

සැකසුම :
**ගරු චාමික සුදර්ශන නි. ම. නි. පියතුමා**
මීසම් සේවක
ඇඹිලිපිටිය.

# උතුම් තිළිණයේ අයිතිකරු ඔබද? මමද?

වත්මන් ලෝකයේ ලැබිය හැකි උතුම්ම සහ වටිනාකමින් ඉහළ තිළිණය වන්නේ, ජීවිතයයි. මෙම උත්තුංග තිළිණයේ වටිනාකම අමිලය. ඔබ මා ලද ජීවිතයේ අයිතිකරු වන්නේ, දෙවියන්වහන්සේය. උන්වහන්සේගෙන් ලද ජීවිතයට වටිනාකමක් එක් කිරීම අප සැමගේ පරම අභිලාෂය විය යුතුය. ඔබ මා ලද මේ දිවියට ඔබ මම දෙවි පියාණන් ඉදිරියේ ගණන් දිය යුතුවෙමු. අද සමාජයේ බොහෝ දෙනාට ලැබෙන සුළු කලකට පමණක් වලංගු වන තෑගි - බෝග සඳහා 'ස්තුතියි' යන වචනය මුවින් පිටවෙයි. එහෙත්, දෙවියන්වහන්සේගෙන් ලද මිල කළ නොහැකි ත්‍යාගයට කීදෙනෙක් 'ස්තුතියි පියාණනි' කියා උන්වහන්සේව අමතත්ද? වර්තමානයේ පැතිර යන වසංගත සියල්ලක්ම සෘජුවම මිනිස් දිවියට බලපාමින්, මිනිස් ජීවිතයේ වටිනාකම පෙන්වා දීමට තරයේ වෑයම් කරයි. ඔබ මා ලද මෙම ජීවිතය ඔබටත් මටත්, අපගේ දෙමාපියන්ටවත්, අයිති වූවක් නොවේ. එහි සැබෑ අයිතිකරුවාණෝ පරමෝත්තම පියාණන් වහන්සේය. අප හැම අවදි වන හැම උදයක්ම, ජීවිතයේ ගෙවී යන සෑම තත්පරයක්ම, වැටෙන හැම හුස්ම බිඳක්ම අප ලබන්නේ අපගේ ජීවිතයේ අයිතිකරුවාණන්ගෙනි. එසේ නම් මේ ජීවන ගංගාව තරණය කරන ජීවිතය නැමති නෞකාව සුදුසු ස්ථානයකට පැදීමට අවැසි වරම් පතමු.

මනුෂ්‍යයන් ලෙස අපට ලැබෙන ත්‍යාග අපි හොඳින් රැක බලා ගන්නෙමු. එහෙත්, වර්තමානය වන විට, උතුම්ම ත්‍යාගය වන ජීවිතය විනාශ කරන්නට බොහෝදෙන උත්සාහ කරති. වත්මන් සමාජය තුළ පුංචි බිළිඳාගේ ජීවත් වීමේ තීරණය ගන්නේද, වෛද්‍යවරුන් හා දරුවාගේ දෙමාපියන්ය. දෙවියන්වහන්සේගෙන් ලද උතුම් තිළිණය තම ස්ව කැමැත්ත පරිදි විනාශ කිරීම කාගේ හෝ රාජකාරියක් නොවිය යුතුය. අද වන විට 'ගබ්සාව' සමහර රටවල නීතිගත කර ඇත. ගබ්සාව බරපතළ පාපයක් වන්නේ, පිළිසිඳගත් මොහොතේ පටන් ජීවිතය දෙවියන්වහන්සේට අයිති නිසාය. "මා නුඹ කුසෙහි පිළිසිඳගැනීම ඇති කරන්නටත් පෙර පටන් නුඹ හඳුනා ගතිමි. නුඹේ උපතට පෙර, මම නුඹ කැප කළෙමි. ජාතීන් හට දිවැසිවරයකු ලෙස මම නුඹ පත් කළෙමි" (ජෙරමියා 1:4-5). කතෝලික සභා ධර්මෝපදේශයට අනුව, ගබ්සාව යනු, අශික්ෂිත අපරාධයකි. මල් කැකුළක් පිපී සමාජයක් සුවඳ කිරීමට නම්, එයට අවශ්‍ය පොහොර හා පෝෂණය ලබා දී, මල් කැකුළ මලක් කර ගන්නා සේම, කුසෙහි සිටින දරුවාටද, නිදහසේ ජීවත් වීමට ඇති අයිතිය නොවළකා ඒ දරුවාටද සමාජයට පිවිසීමට ඉඩක් ලබා දිය යුතුය. ජීවිතයක අයිතිය හා වටිනාකම විනාශ කරන බරපතළම පාපය ගබ්සාව වන අතර, එය වළක්වාලිය හැක්කේ, දෙමාපියන්ටමය. සමාජයක ජීවත් වන කවුරු හෝ අමරණීය නොවෙති. මරණය නමැති නිත්‍ය වූ සත්‍යය අපව වෙළා ගත් විට, දෙවි සමිඳුන් ඉදිරියේ කරන්නට සිදුවන ගණන් දීමෙන් කිසිවකුටත් මුවා වී සිටිය නොහැකිය. කතෝලිකයන් ලෙස අපගේ ඒකායන අරමුණ වී ඇත්තේ ස්වර්ගීය සැපත ලබා ගැනීමය. ස්වර්ගීය සැපත ලබා ගැනීමට පවින් වැළකී, දෙවියන්ගෙන් ලද තිළිණයට වටිනාකමක් එක් කරමු.

මොහොතකට අපි මෙසේ සිතමු. ඔබට පුද්ගලයකුගෙන් ත්‍යාගයක් ලැබුණු විට, ඔබ එය කැබලි කොට වෙන කාර්යයකට යොදා ගතහොත්, ත්‍යාගය දුන් පුද්ගලයාට ඔබ කෙරෙහි ඇති වන්නේ තරහක් හා දුකකි. එසේම, අපගේ පෞද්ගලික ආරවුලක් හේතුවෙන් ජීවිතය නසා ගත් විට දෙවි පියාණන්ට කෙතරම් දුකක් ඇති වනවාද? උදාහරණයක් ලෙස, පහත සත්‍ය සිදුවීම සලකමු. "පාසලක උසස් පෙළ හදාරන ශිෂ්‍යයෙක් තවත් ශිෂ්‍යාවක සමඟ ප්‍රේම සබඳතාවක් ගොඩනගා ගෙන, අවසානයේ ඒ ශිෂ්‍යාව තවත් සිසුවකු සමඟ ප්‍රේම සබඳතාවක් ගොඩනගාගත් දුකට හා ආවේගයට රාත්‍රියේ ගෙල වැල ලා ගෙන ජීවිතක්ෂයට පත්විය". මෙවැනි අර්ථ විරහිත ක්‍රියා කර ගැනීමෙන් වටිනා ජීවිත සිය දහස් ගණනින් මරු මුවට ළං වන්නේ, ජීවිතයේ හිමිකාරීත්වය තමාගේම යටතට ගැනීමෙනි. කතෝලික සභා

ධර්මෝපදේශයට අනුව, මෙසේ සඳහන් කරයි. "දෙවියන්වහන්සේ අපට පවරා ඇති ජීවිතයේ හිමිකරුද දෙවියන්වහන්සේ මිස අපි නොවෙමු. සිය දිවි නසා ගැනීම දෙවියන්වහන්සේට දිය යුතු ප්‍රේමයට විරුද්ධ වීමකි"(ක.ස.ධ. 2280 - 2281). අපගේ ජීවිතය පිළිබඳ අප නොදන්නා කරුණක් නම්, අපගේ මරණය, දින, පැය හා වේලාවයි. දෙවියන්වහන්සේගේ අභිමතය පරිදි ඔබට මට හිමි වූ මේ ජීවිතය උන්වහන්සේගේ කැඳවා ගන්නා තුරු එය බලෙන් භාර දීමට වෙර දැරීම මහ බරපතළ පාපයකි. සමාජයක් වශයෙන් අප එකට එකමුතු වී ජීවිතයේ වටිනාකම කියා දීමටත්, තේරුම් ගැනීමටත් උත්සාහ කරමු. දෙවිඳුන්ගෙන් ලද ජීවිතය නිසියාකාරව නැවත දෙවිඳුන් වෙත පුද කිරීමට පොරොන්දු වෙමු. අපගේ තලෙන්තු සමාජයේ අන් අයගේ යහපත උදෙසා කැප කරමු. අපි ලද මෙම ජීවිතය අන් අය උදෙසා යාග කොට, දෙවිඳුන් ඉදිරියේ ජීවිතයට මිලක් දුන් සැබෑ විරුවන් ලෙස පෙනී සිටිමු.

අපගේ ජීවිත ගමන වන්දනා ගමනකි. මේ වන්දනා ගමනේ, අවසානය ස්වර්ගය විය යුතුය. ඊට පහළ හා අවම ස්ථානයක් යෝජනා කිරීම ඔබේ මගේ වගකීමක් නොවේ. මේ ජීවිත ගමන අතරමග විවිධ බාධක, කඩා වැටීම් හා සිත් වේදනා පැමිණීම නියතය. මෙසේ බාධකවලට මැදි වී කල් මැරීම දේව තිළිණයට කරන නිගාවකි. බාධකවලට මැදි නොවී, දේව අභිමතය පමණක් අප ඉටු කළ යුතුය. ගංගාවක් පහළට ඇදී ගොස් මුහුදට පිවිසීමට කෙතරම් බාධක හමුවේ නොනැවතී ඉදිරියටම ගොස්, අපගේ ජීවිතයේ සැබෑ නියමුවාණන් වන දෙවි පියාණන්ට අපගේ ජීවිතය පුද දිය යුතුය. රත්න ශ්‍රී විජේසිංහ ශූරීන් අතින් විරචිත වූ 'මග' නම් පැදි පෙළේ කොටසක් සිතට නැගේ.

අම්බලම් - විසිතුරු සල්පිලෙන්
වටරවුම් - පදිකා මල් වැටෙන්
සෙවණලු සඳන තුරුලිය පෙළින්
සැදි දෙපස මනරම් - සෝබනා
මොහොතක ඉසිඹු ලබනා විනා
නැත අතරමග නතරවන වාසනා

කතෝලිකයන් ලෙස අපි, දෙවිඳුන්ගෙන් ලද උතුම් තිළිණය දෙවිඳුන්ට ප්‍රසන්න ආකාරයෙන් නැවත පුද දෙමු. දේව ජීවිතයේ අයිතිය ඔබ - මම නොව දෙවියන් වහන්සේටම පුද කරමු. අන් අයගේ ජීවිතවල අයිතිය ද අපි බාර නොගෙන, මේ සැම ජීවිතයකටම රජාණන් වූ දෙවිඳුන් හට පුද දෙමු. අප ජීවිත සේම අන් ජීවිතද සුරකිමින්, ඔබ - මම ලද මේ උතුම් තිළිණයේ සැබෑම අයිතිකරුවාණන් දෙවි පියාණන් පමණක්ම බව තරයේම සිත්හි තබාගෙන දෙවිඳුන්ට ප්‍රසන්න දිවියක් ගත කිරීමට පොරොන්දු වෙමු. අවසානයේ, "පියාණනි ඔබ හස්තයට මාගේ ආත්මය භාර දෙමි" (ලූක් 23:46) යයි කියමින් දෙවිඳුන්ගෙන් ලද මේ උත්තුංග ත්‍යාගය යළි දේව දෝතට භාර කරමු.

**බුද්ධික සඳරුවන්**
ශාන්ත අන්තෝනි දේවස්ථානය
දළුපොත

## වගකීමක් වූ නිදහස

නිදහසේ අරුණලු වැටී
සිත් සතන් අප එකලු වී
සැමරුවත් හදවත් තුළින්
ලැබෙන නිදහස තිර ලෙසින්

නිදහසක් නැති දිවි පුරා
දහසකුත් වැඩ ඉටු කළා
සැවොම නිදහස ප්‍රිය කළා
නිදහස වගකීමක් වෙලා

අගය නිදහසෙ වැටහුණත්
අප සිටින්නේ නිදිමතින්
එකාවන් වී එක්වුවොත්
මැවේ එතනත් සුරලොවක්

රට දැයට ආදරෙ වෙමින්
කළොත් වැඩ නිති යහපතින්
බබුළුවා මේ පොඩි රටත්
දිනන්නට හැක ලෝකයක්

**මනුක වීරසේකර**
වල්දෙණිය, කැගල්ල

# කතෝලික ධර්මය
## අ. පො. ස. (සා/පෙළ) විභාගය - 2022
## ආදර්ශ ප්‍රශ්න පත්‍රය - II කොටස

01.
1) මරිය තුමියට අපගේ ගෞරවය හිමි වීමට හේතු 2ක් ලියන්න.
2) ක්‍රි.ව. 1917 දී පෘතුගාලයේ පාතිමා නුවර දේව මාතාවන් දර්ශනය වූයේ කාටද?
3) වේලක්කන්නි නුවර දේව මාතාවන් සිදුකළ ප්‍රාතිහාර්ය 2ක් ලියන්න.
4) දෙවන වතිකානු මන්ත්‍රණ සභාවට පෙර, "යාම යැදුම" හැඳින්වූයේ කෙසේද?
5) පූජක පැවිදි සහ ගිහි සියලු දෙනා "යාම යාච්ඤාව" උච්චාරණය කිරීමෙන් ක්‍රියාත්මක කරවන්නේ කුමක්ද?
6) ක්‍රි.ව. 381 - 384 කාලයේ "යාම යැදුම් සම්ප්‍රදාය" ජෙරුසලමේ තිබූ බවට තම දින පොතේ සඳහන් කළ පැවිදි කාන්තාව කවුද?
7) දේවවන්දනාව තුළ වැදගත්ම දිනය කුමක්ද?
8) දේවවන්දනා වසරේ ප්‍රධාන හා ප්‍රථම මංගලෝත්සවය කුමක්ද?
9) ස්තෝත්‍ර යාගික පිළිවෙතේ ප්‍රධාන කොටස් 2ක් නම් කරන්න?
10) ජුවාම් 17 වන පරිච්ඡේදයේ සඳහන් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දූත මෙහෙවර කැටිකර දක්වන යැදුම කුමක්ද?

02.
1) මල් උයන ලෙස හඳුන්වන්නේ කුමන උයනද?
2) මල් උයනේ යාච්ඤාවෙන් පෙන්නුම් කරනු ලබන කරුණු 3ක් ලියන්න.
3) නොමඟට ගිය තම මිතුරකුව යහමගට ගැනීමට ඔබට කළහැකි කාර්ය 5ක් ලියන්න.

03.
1) දිව්‍ය පූජාවේ ප්‍රධාන කොටස් 2ක් නම් කරන්න.
2) දිව්‍ය පූජාව තුළ ආරම්භයේ දක්නට ලැබෙන ගෞරවයේ සංකේත 3ක් නම් කරන්න.
3) දිව්‍ය පූජාවේ පිළිවෙත් 5ක් නම් කරන්න.

04.
1) පරමණ්ඩල යාච්ඤාව අඩංගු සුවිශේෂ දෙක නම් කරන්න.
2) පරමණ්ඩල යාච්ඤාවේ අඩංගු ප්‍රශංසාත්මක පැතුම් තුන නම් කරන්න.
3) ලෝකයේ පවතිනා කොවිඩ් වසංගත තත්ත්වය තුළ අප රට හා විශ්වයම එයින් මුදා ගන්නා ලෙස ඉල්ලා යැදුමක් සකස් කරන්න.

05.
1) සුරදූත ගීය ගායනා නොකරන කාලය කුමක්ද?
2) දේවවන්දනාවේ ප්‍රධාන අංග තුන නම් කරන්න.
3) චතාරික කාලය තුළ ඔබට කළ හැකි විශේෂ යහපත් ක්‍රියා 5ක් ලියන්න.

## II කොටස - පිළිතුරු

01.
1) දේව පුත්‍රයාණන්ගේ මාතාව වීම./ ජන්ම පාපයෙන් නිර්දෝෂව පිළිසිඳ ගැනීම./ දේව වරප්‍රසාදයෙන් පූර්ණ වීම./ ආත්ම ශරීර පිටින් සුරලොවට වැඩීම.
2) ප්‍රැන්සිස්කෝ, ජසින්තා සහ ලුසී
3) කිරි කළයේ කිරි අඩු නොවීම./ කොර දරුවකු සුවපත් කිරීම.
4) දේවකාරිය
5) ප්‍රසාද ස්නාපනයෙන් ලැබී ඇති පොදු පූජකවරය.
6) ස්පාඤ්ඤ ජාතික 'එජේරියා'
7) ඉරිදා දිනය.
8) පාස්කු ඉරිදා ක්‍රිස්තුත්ථාන මංගල මහෝත්සවය.
9) ස්තෝත්‍ර යාගික යැදුම./ ස්වාමිවාක් ආරාධනාව, සාමය පැතීම හා පූප කැඩීම./ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දානය කිරීම හා බොදුනෙන් පසු යැදුම.
10) උත්තම පූජක යැදුම.

02.
1) ගෙත්සෙමනෙ උයන.
2) ජේසුස් වහන්සේගේ සැබෑ මනුෂ්‍යත්වය/ උන්වහන්සේගේ දුක්ප්‍රාප්තිය/ දෙවියන්වහන්සේ හා ක්‍රිස්තුන් වහන්සේ අතර ඇති සබඳතාව.
3) සිසු අදහස්.

03.
1) දේව වාක්‍ය පිළිවෙත/ ස්තෝත්‍ර යාගික පිළිවෙත.
2) නමස්කාරය/ සුවඳ දුම්/ පූජාසනය සිපාචාරය/ දල්වන ලද පහන්.
3) ආරම්භක පිළිවෙත/ දේව වාක්‍ය පිළිවෙත/ පුදසුන සූදානම් කිරීමේ පිළිවෙත/ ස්තෝත්‍ර යාගික පිළිවෙත/ ධර්මදූත කාර්යය සඳහා පිටත් කර යැවීම.

04.
1) ලූක් හා මතෙව් සුබාරංචි
2) ඔබ වහන්සේගේ ශ්‍රී නාමයට ප්‍රශංසා වේවා./ ඔබ වහන්සේගේ රාජ්‍යය පැමිණේවා./ ඔබ වහන්සේගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් මෙලොවෙහිද ඉටුවේවා.
3) සිසු අදහස්.

05.
1) චතාරික කාලය.
2) දිව්‍ය පූජාව/ දේව ප්‍රසාද නිධාන/ යාම යැදුම
3) සිසු අදහස්.

**ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය.**
විදුහල්පතිනිය - මිනු/ පහළ මඩම්පැල්ල කනිෂ්ඨ විද්‍යාලය - කටාන.

## විශ්ව සභා ඉතිහාසය (V)
## අ. පො. ස. (උ.පෙ.) ක්‍රිස්තියානි ධර්මය / ශිෂ්ටාචාරය සඳහා අත්වැලකි.
සභා පිය දේව ධර්මය

**තර්කවේදීහු (ක්‍රිස්තියානි චින්තකයෝ)**

පෙර පල වූ කලාපයේ දී තර්කවේදීන් සම්බන්ධව හැඳින්වීම සාකච්ඡාවට බඳුන් විය. මෙම ලිපියෙන් තර්කවේදීන් හෙවත් ඇපොලොජිස්ත ලේඛකයන් ලෙස එක් එක් පුද්ගලයා ගැන පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

1. ශුද්ධවූ ජස්ටින් තුමා
2. ඇලෙක්සැන්ඩ්‍රියාවේ ශුද්ධවූ අතනාසියුස් තුමා
3. ශුද්ධවූ ජෙරෝම් තුමා
4. ඇලෙක්සැන්ඩ්‍රියාවේ ශුද්ධවූ සිරිල් තුමා
5. හිප්පෝ හී අගෝස්තීනු තුමා
6. ශුද්ධවූ ඔරිගන් තුමා
7. ශුද්ධවූ ටර්ටුලියන් තුමා
8. ඇලෙක්සැන්ඩ්‍රියාවේ ශුද්ධවූ ක්ලෙමන්ට් තුමා
9. ශුද්ධවූ ඉරේනියස් තුමා

**ප්‍රාණපරිත්‍යාගී ශුද්ධවූ ජස්ටින් තුමා (ක්‍රි. ව. 100-165)**

ක්‍රි. ව. 100-103 පමණ පලස්තීනයේ සමාරිය ප්‍රදේශයේ ෂිකේන් ග්‍රාමයේ උපත ලබා ඇත. ක්‍රි. ව. 165 දී රෝම අධිරාජයා වූ මාර්කුස් අවුරේලියස් විසින් රෝමානු දෙවිවරුන්ට එතුමා වන්දනා නොකිරීම හේතුවෙන් හිස ගසා මරා දමන ලදි. එතුමා ස්ටොයික්, ඇරිස්ටෝටල්, පයිතගරස් සහ ප්ලේටෝ යන අයගේ දර්ශන හැදෑරුවත් සත්‍ය අවබෝධ නොවීය. ක්‍රි. ව. 132 දී එපීසියේ ක්‍රිස්තු භක්තික තරුණයකුගෙන් ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම් කවරේදැයි එතුමාට දැනගන්නට ලැබිණි. ඉන් පසු ක්‍රිස්තු ධර්මයේ පවතින දර්ශනවාදී ලක්ෂණ ඔස්සේ එතුමාගේ තර්ක බුද්ධිය මෙහෙය වීය. එතුමා ක්‍රිස්තු ධර්මය වැළඳ ගත්තේ වයස අවුරුදු 30 දී පමණය. එතුමාගේ ජීවිත වෙනසට බලපෑ ප්‍රධාන හේතුව වූයේ "ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් ප්‍රාණපරිත්‍යාගි වීමට ජනතාව ඉදිරිපත් වුවත් දාර්ශනිකයන්ගේ දාර්ශනික ඉගැන්වීම් වෙනුවෙන් කිසිවකු ප්‍රාණපරිත්‍යාගි වීමට කැමැත්තක් නොදැක් වීමයි".

ජස්ටින්තුමා කිතු දහමේ එන නිර්මල සත්‍යතා නිවැරදිව හඳුනාගෙන ජුදා සහ අන්‍ය ජාතීන්ව දැනුවත් කිරීම සඳහා ඉගැන්වීම් කර ඇත. එතුමා පෙන්වා දෙන්නේ අධිරාජ්‍යයේ සිටින යහපත් පුරවැසියන් ක්‍රිස්තු භක්තිකයන් බවය. හෙලනිස්තකරණය හේතුවෙන් ක්‍රිස්තියානි සමාජයට වූ බලපෑම එතුමා ගැඹුරින් පෙන්වා දුනි. ක්‍රිස්තියානි ධර්මය ඉගැන්වීමට රෝමයේ දර්ශන පීඨ ආරම්භ කිරීමට එතුමා පුරෝගාමී වූ අතර එපීසියේ උසස් අධ්‍යාපන ආයතනයක දේශකයෙක් විය. ජස්ටින් තුමා විසින් රචනා කරන ලද ඇපලෝජිස්ත ලේඛන 3 කි. "විශිෂ්ට ලේඛක"යන විරුදය ලත් එතුමාගේ ග්‍රන්ථ,

1. අන්තෝනියුස් පියුස් අධිරාජයාට ලියන ලද ඇපලෝජියා ලේඛනය
2. රෝම සෙනෙට් සභාවට ලියූ ලේඛනය
3. ජුදා ජාතික ට්‍රයිෆෝ සමග ඇතිවූ සංවාදය ඇතුළත් ලේඛනය

**ඇලෙක්සැන්ඩ්‍රියාවේ ශුද්ධවූ අතනාසියුස් තුමා (ක්‍රි. ව. 295-373)**

එතුමා ක්‍රි. ව. 295 දී ඇලෙක්සැන්ඩ්‍රියාවේ දී උපත ලබා ඇත. දැඩි තාපස දිවියකට ඇතුළු වූ එතුමා ඇලෙක්සැන්ඩ්‍රියානු අනුශාසක පාසලේ අධිපති ධුරයට පත් විය. ඒ පදවියේ රදගුරුතුමාගේ ලේකම් වරයා ලෙසද කලක් කටයුතු කර ඇත. එවකට මතුවූ ඒරියන් වාදයට විරුද්ධව ප්‍රසිද්ධියේ කරුණු දැක්වූ එතුමා ක්‍රි. ව. 325 දී පවත් වනු ලැබූ නිසියානු මන්ත්‍රණ සභාවට සහභාගි වූ දේව ධර්මධරයෙක් විය. ඒරියන් වාදයෙන් සභාව මුදවා ගැනීමේ පුරෝගාමියා වූයේ එතුමාය. අතනාසියුස් තුමා ඉගැන් වීම් කිහිපයක් පෙන්වා දෙන්නේය.

**"ක්‍රිස්තුස් වහන්සේ පියාණන් වහන්සේගෙන් ජනිත වූ නමුත් මවනු නොලැබ එකම භවත්වය ඇතිව වැඩසිටින බවයි".** එය නිසියාන මන්ත්‍රණ

සභාවේ ප්‍රධාන දේව ධාර්මික ඉගැන්වීම බවට පත් විය.

**"ශුද්ධාත්මයාණන් වහන්සේ පියාණන් හා පුත්‍රයාණන් වෙතින් නික්මෙන"** බව,

**"ස්වාමින් වහන්සේගේ රාත්‍රී භෝජනය සුපරිස්මරණය කරන්නාවූ ඕනෑම අවස්ථාවක මිදි යුෂ හා රොටි මතට ශුද්ධාත්මයාණන් වැඩම කරන"** බව,

එතුමා මරියෝත්තමාවන්ගේ කන්‍ය මාතෘත්වය හා සම්බන්ධවද, බයිබලය සම්බන්ධවද ගැටපද විවරණයක්ද ලියා ඇත. එතුමා රචනා කළ ප්‍රධාන කෘති අතර "ඒරියන් වාදයට එරෙහිව", "මාංසවත් වීම" සහ "බයිබලීය ටීකාව" ප්‍රධාන වේ. "ඩි ඩික්‍රියේටිස් නයිකානේ සිනෝඩ්" කෘතියෙන් පෙන්වා දෙන්නේ පියාණන්වහන්සේගේ භාවාර්ථයයි. එතුමා කතෝලික සභාවේ **සාම්ප්‍රදායික ඇදහිල්ලේ පියා** ලෙස හඳුන්වයි.

**ශු. ජෙරෝම් තුමා (ක්‍රි. ව. 347-420)**

උතුරු ඉතාලියේ ස්ට්‍රයිඩන් නුවර උපත ලැබූ එතුමා අධ්‍යාපනය රෝමයේ දී ලබා ඇත. වසර 19 දී බව්තිස්මය ලබා පසුව ක්‍රි. ව. 385 දී බෙත්ලෙහෙමට ගොස් තාපස දිවියක් ගත කර ඇත. ලතින් සභා පියවරුන් අතර ශ්‍රේෂ්ඨයෙකි. ග්‍රීක හා හේබ්‍රෙව් භාෂා හදාරා ඩැමාසුස් පාප් තුමාගේ ලේකම් ලෙස කටයුතු කර ඇත. ක්‍රි. ව. 397 දී 3 වන කාර්තේජ් සම්මේලනයේ සහායවූ රදගුරු තුමෙක් විය.

ඩැමාසුස් පාප්තුමාගේ ඉල්ලීම පරිදි හෙබ්‍රෙව් ශුද්ධ බයිබලය ලතින් භාෂාවට පරිවර්තනය කළේ එතුමා විසිනි. පරිවර්තනය සඳහා එතුමන්ට වසර 24 ක් පමණ ගත වී එය නිමා කරන ලද්දේ ක්‍රි. ව. 406 දී පමණය. එම පිටපත වල්ගේට් (වුල්ගාතා) හෙවත් "පොදු ජනතාවගේ පිටපත" ලෙස හැඳින්වේ. එමෙන්ම "විශිෂ්ට පුද්ගලයන්ගේ ජීවිත චරිත" එතුමාගේ තවත් ග්‍රන්ථයක් වේ. ඒ පුස්තකයේ පේදුරු තුමාගේ සිට ශුද්ධවූ සභාවට සේවය කර ප්‍රාණපරිත්‍යාගී වූ සහ සභාවේ දියුණුවට දායකවූවන් 135 දෙනකුගේ ජීවිත තොරතුරු ඇතුළත්වේ. "ද්විතීය සම්මත ග්‍රන්ථ හා ප්‍රදා ලියවිලි" කෘතිය ද එතුමා රචනා කළ කෘතී වේ. "මූලික සිද්ධාන්ත" කෘතිය ලතින් භාෂාවට පරිවර්තනය කර ඇත්තේද එතුමා විසිනි.

එතුමා දේව ධර්ම විශාරදයෙකි. තමන්ගේ දූත සේවාව නිම කිරීමෙන් පසුව ඉශ්‍රායෙලයට ගොස් ඉතා දුෂ්කර තපස් ජීවිතයක් ගත කර ක්‍රි. ව. 420 දී මිය ගියේය.

සටහන

**ශාස්ත්‍රපති එස්. හේමාල් පෙරේරා**

## සන්සුන් කළ සිත

| | |
|---|---|
| මහවැලි නදිය ගලනා හැටි | මනහරය |
| හෝ හෝ හඬින් දුවනා දිය | බියකරුය |
| ප්ලාස්ටික් ෂොපින් මලු පිරි කුණු ගොඩ | වැඩිය |
| සුන්දර ගඟ වැනසුවේ සිත් නැති | අයය |
| | |
| පොල් ගොල්ල වේල්ලට සවසක ගිය | අතර |
| දුටු දර්ශනය දෙස බැලුවෙමි වී | නතර |
| දුව පැන ඇවිද "එක්සයිසස්" කරන | අය |
| කිසිවෙක් අහන්නේ නැත්තේ කවුද | ඔබ |
| | |
| ගං ඉවුරේ ගස් වැවිලා | සිසිලක්ය |
| කලබල සිත නතර කරයි | වනපතිය |
| ගත සිත නිවන මේ රුක්වල ඇති | බලය |
| නිසල යාමයේ ඇසුණේ දෙව් | හඬය |
| | |
| ලේවැල්ලේ පිහිටි පතිමා | ආරාමේ |
| සන්සුන් කරයි සිත සුවයක් ගෙන | දෙමිනේ |
| ඔසුවක් වැනිය ඔවදන් බේලන් | පියගේ |
| ජේසුනුවනේ මේ තුති බැති ඔබට | පිදේ |

**එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා**

# මහලු විය

ඉතින් සියලු දෙනාටම සුබ දවසක්. පින්බර ජීවිතය තුළින් මන් නැවතත් ජීවිතයේ එක් අම්හිරි කොටසක් ගැන තමයි කතා කරන්නේ. ඒ තමයි අපි කවුරුත් වෙනවාට අකමැති මහලු විය. මේ මහලු වියේ සිටින අපේ රටේ මිනිස්සු ගත්තම ගොඩාක් කලකිරීමෙන් තමයි ජීවත් වෙන්නේ. මොකද ඒ වන විට තමා සාමාන්‍ය ජීවිතයේ කිරීමට ඇති ගොඩාක් දේවල් කරලා, ඒ වගේම ඒ කරපු යම් යම් දේවල් නිසා තමන් සතුටින්ද, තවත් දෙවල් නිසා දුකින්ද සිටී. මහලු කාලය වන විට බෝහෝ දෙනෙක් තම රැකියා සහ තම දූ දරුවන්ගෙන් වෙන් වී හුදෙකලා වී සිටිති. තවද තමන් මහලු වුණත් තම දරුවන්ගෙ ප්‍රශ්න විසඳීමට බැරුව කනස්සල්ලෙන් සිටියි. තමන්ගේ අත පය වාරු නැති වෙයි, හම රැලි වැටෙයි. විවිධ ලෙඩ දුක්වලට ගොදුරු වෙයි. ඉතින් ඔන්න ඔය වගේ ගැටලු රාශියක් මහලු වියට යනවත් සමගම අපට මුහුණ දෙන්න වෙනවා. මේවා ඒතරම් ලොකුවට සිතිය යුතු ගැටලු නොවේ. අප සියලු දෙනාම දිනයක වයසට යනවා අපි මේ දේවලට අපේ ජීවන ගමන හුරුපුරුදු කරගන්න ඕන. දහමට අනුව මේ ලෝකේ කිසිවක් සදාකාලික නැත. මහලු වියට පත් වෙනවත් සමග මීට අමතරව ලෝබකම වැඩි වේ. ඉක්මනින් කේන්ති යයි. තවත් සමහරු ලෙඩට දුකට බෙහෙත් නොගනිති. දිනපතා මත් පැන් පානයට හුරු වෙති. මේවාද මහලු වියේදී තමන්ට එන ගැටලු වේ. නමුත් මේ කිසි දෙයකින් ඔබට තරුණ වියට පැමිණීමට වත් ඔබේ කලකිරීම නැති කර ගැනිමටවත් කිසිදු උදව්වක් නොවේ. මෙයින් ඔබ තව තවත් දුර්වල කරයි. මහලු වියේ ඔබ මේ සියලු දේ අත් හල යුතුයි. සියලු බැඳීම්වලින් ඈත් විය යුතුයි. ඒ වගේම ඔබ බොහොම සැහැල්ලුවෙන් සිතීමට පුරුදු විය යුතුයි. මුදල් ගැන හෝ වෙන කිසි දෙයක් ගැන වැඩි දුර නොසිතන්න. ජීවිතයේ ඔබ ගතකළ සුන්දර අවස්ථා පමණක් මතක තබා ගන්න. අම්හිරි දේවල් සිතින් ඈත් කරගන්න ඔබ මරණයේදී රැගෙන යන්නේ ඔබ සතු ධනය නොවේ, ඔබ සතු සිතුවිලිය. එම නිසා සිත සතුටු වන දේවල් පමණක් කරන්න. එවිට ඔබේ මහලු කාලය කටුක අම්හිරි දෙයක් නොවේ. හොඳයි ඉතින් මා බොහොම සරලව අපි කාටත් අත් විඳින්න සිදුවන මහලු කාලය ගැන සහ මහලු කාලය ගතකළ යුත්තේ කෙසේද යන්න කෙටි පැහැදිලි කිරීමක් තමයි කරේ. ඉතින් තවත් මේ වගේ ලිපියක් පින්බර ජීවිතය තුළින් ගෙන ඒමට බලාපොරොත්තුවෙමි. (ඔබේ අදහස්ද මා වෙත එවන්න).

**එම්. ඒ. ඩී. රුවිනි කාවින්ද්‍යා**
නිවන්දම

## ආදරණීය දරුවනි

"ළමා ප්‍රබෝධනය" ට
ඔබගේ ලස්සන නිර්මාණ,
කවි, ගීත, නිසඳැස්,
කෙටිකතා, ලිපි, සිතුවිලි
ආදී වශයෙන් ලබා ගැනීමට,
අපි බොහොම කැමැත්තෙන් සිටිමු.
ඔබ එවන ඒ නිර්මාණය සමඟ
පන්තිභාර ගුරුතුමාගේ හෝ
ගුරුතුමියගේ අත්සන ඇතිව
අප වෙත එවන්න.

**සංස්කාරක පියතුමා.**
**"භක්ති ප්‍රබෝධනය"**
**265, ඩීන්ස් පාර, මරදාන,**
**කොළඹ 10.**
Email: bhakthi.prabodhanaya@gmail.com

## භක්ති ප්‍රබෝධනය ඉදිරි තේමාවන්

**2022 මාර්තු - අප්‍රේල් මාස - "කුරුස පාමුල"**
**2022 මැයි මාසය - "අම්මා"**
(මැයි කලාපය සඳහා ඔබ එවන ලිපි මාර්තු 20 ට පෙර අප වෙත එවන්න.)



# ශාන්ත එයුජින් ශිෂ්‍යත්වය

නිර්මල මරිය නිකායේ දෙව්සත්හල්වල අධ්‍යාපනය ලැබූ ආදි සිසුන් විසින් පිරිනමන. ශාන්ත එයුජින් ශිෂ්‍යත්ව සඳහා අයදුම් පත් භාර ගනු ලැබේ. ඒ සඳහා පසු ගිය අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් අවම වශයෙන් සාමර්ථ්‍ය පහක් (5) ලබා ඇති සිසුනට අයදුම් කළ හැකිය.

පවුලේ විස්තර, විභාග ප්‍රතිඵල ඇතුළු සියලු විස්තර අඩංගු අයදුම් පතක් 2022 පෙබරවාරි 28 වන දිනට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන්නට සලස්වන්න.

ලිපිනය :
ශාන්ත එයුජින් ආදි සිසු සංගමය
ගරු අර්වින් එම්. මොරායස් නි. ම. නි. පියතුමා බාරේ
පාතිමා අප ස්වාමිදූගේ දේවස්ථානය
අංක 271.
ඩීන්ස් පාර.
මරදාන.
කොළඹ 10.



# වත්තල නගරයෙන්

HARBOUR VIEW DIKKOWITA

ඇළකන්දට 1.5km

කොළඹට 3.5 km

අධිවේගි මාර්ගයට විනාඩි 5 න්

700m to PEGASUS REEF



**පර්චසයක් ලක්ෂ 8.95 සිට**

**සියලුම පහසුකම් සමඟින්**

SAVI LANDS

**+94 777 51 87 87**

www.savilands.lk

මිල රු.40/=
(සහන මිල)

"භක්ති ප්‍රබෝධනය" සංස්කාරක ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමා විසින් කොළඹ කතෝලික මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී. පුවත් පතක් ලෙස තැපැල් හලේ ලියාපදිංචි කර ඇත. QD/NEWS/09/2022